- අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සිදුකර නිර්දේශ හා යෝජනා සමඟ වාර්තා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සහ විගණන කටයුතුවලට අදාළ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
- අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන සම්බන්ධ කර ගනිමින් කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම සහ අදාළ කරුණු සමාලෝචනය කිරීම.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි විමර්ශන කටයුතු සිදුකිරීම.
- විශේෂ විදේශ ආධාර ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ කමිටුව වෙත ව්‍යාපෘති විගණකවරයකු වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක පත් කරන අවස්ථාවලදී ව්‍යාපෘති ප්‍රගාමී විගණනය.
- විගණකාධිපති වෙතින් අමාත්‍යාංශයට ලැබෙන විගණන විමසුම් පිළිබඳ පසු විපරම් කිරීම.

2017 වර්ෂය තුළ නිම කළ කාර්යයන්,

2017 වර්ෂය වෙනුවෙන් මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විගණනය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර ඇති අතර, ඒ යටතේ ඇති කරුණු සහ ඉන් පරිබාහිර කරුණු යටතේ 2017 වසර තුළ පහත සඳහන් විගණන කටයුතු සහ විමර්ශන කටයුතු සිදුකර ඇත.

- 2017 වසර තුළ පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගණන 04කි.
- අමාත්‍යාංශයේ සියලුම අංශවල වාර්ෂික ප්‍රගතිය ආවරණය වන පරිදි විගණනයට ලක් කර ඉදිරිපත් කර ඇති කාර්තු වාර්තා සංඛ්‍යාව 04 කි.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි කරුණු සම්බන්ධයෙන් සිදුකෙරුණු විමර්ශන වාර්තා සංඛ්‍යාව 07 කි.
- අමාත්‍යාංශයේ මූල්‍ය, මානව සම්පත් සහ සංවර්ධන කටයුතුවල කාර්යක්ෂමතාව සහ ඵලදායීත්වය වැඩි කිරීම සඳහා යෝජනා සහිතව ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව 10 කි.
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල කටයුතු සම්බන්ධව සිදුකරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂණ සංඛ්‍යාව 16 කි.
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පවරනු ලැබූ විශේෂ පරීක්ෂණ සංඛ්‍යාව 05 කි.

# 08. කාර්යසාධන ප්‍රගතිය

ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම, පශු සම්පත් නිෂ්පාදන වර්ධනය කිරීම තුළින් දේශීය ඉල්ලුම සපුරාලීම, පශු සම්පත් නිෂ්පාදන සඳහා අලෙවි ජාලයක් ඇති කිරීම, කෘෂි නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම, නිෂ්පාදිත අලෙවිකරණය සම්බන්ධීකරණය තුළින් දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක කාර්යයන් ආශ්‍රයෙන් මෙම අමාත්‍යාංශ කාර්යයන් ක්‍රියාත්මක වන අතර, මෙම ක්ෂේත්‍රයන්හි ප්‍රගමනයට අමාත්‍යාංශය මඟින් ලබා දිය යුතු දායකත්වය මෙම වසරේදී අඛණ්ඩව ලබා දෙමින් අමාත්‍යාංශ ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාකර ඇත.

ආහාර සුරක්ෂිතතාවය සඳහා වන දායකත්වය මෙන්ම, ජීවනෝපාය මාර්ගයක් වශයෙන්ද, පශු සම්පත් ක්ෂේත්‍රය දේශීය ආර්ථිකය තුළ වැදගත් වේ. දැනට දළ වශයෙන් මෙම අංශයේ පවුල් මිලියනයක් පමණ නිරත වන අතර, මින් බහුතරයක් ග්‍රාමීය අංශය නියෝජනය කරනු ලබයි. වඩාත් සෞඛ්‍යාරක්ෂිත සහ ගුණාත්මක ආකාරයෙන් සත්ත්ව නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ඉහළ යන දේශීය ඉල්ලුම සපුරාලීම සහ එමඟින් පශු නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය සීමා කිරීම යන අරමුණු පෙරදැරිව මෙම අමාත්‍යාංශය මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළව විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව කටයුතු කරන අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර, සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත් වන අතර පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැකසීම සඳහා අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමද සිදුවේ.

සත්ත්ව පාලනය ඵලදායී ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම ගොවීන්ට ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් අතර, එක් එක් දේශගුණික කලාප වලට සුදුසු වන පරිදි ගොවිපොළවල නුමුහුන් හා දෙමුහුන් සතුන් අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. පස නිසරු වීම වැළැක්වීමට හා පසෙහි සාරවත් බව වර්ධනය කිරීමට පරිසර හිතකාමී භූමි පරිහරණ ශිල්ප ක්‍රම හඳුන්වා දී ඇත.

ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගාසිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය හා ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධනය අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වැඩසටහන් අතර තෝරාගත් දිස්ත්‍රික්ක 10ක ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2017 ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම කෘෂි නිෂ්පාදන සඳහා වන වෙළෙඳපොළ මිල ස්ථායීකරණය හා ඒවායේ පසු අස්වනු හානිය අවම කිරීම

ඉලක්ක කරගනිමින් දඹුල්ල හා කැප්පැටිපොල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට ආසන්නව ශීතාගාර පහසුකම් ඉදිකිරීම/ස්ථාපනය කිරීමේ ව්‍යාපෘති අරඹා ඇත.

වාණිජමය වශයෙන් විභවයක් ඇති කිතුල් නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය කිරීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ස්වයං රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම, කිතුල් කාර්මිකයන් සහ ව්‍යවසායකයින් සඳහා ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැංවීම, දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ සඳහා ගුණාත්මක කිතුල් නිෂ්පාදනය ප්‍රචලිත කිරීම, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා කිතුල් කර්මාන්තය ආශ්‍රිතව පවතින ගැටළු හා නීතිමය ගැටළු අවම කිරීම සඳහා අවධානය යොමු කර ඇත.

එමෙන්ම සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය හා මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුක්තිකයන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා හා මෙම කර්මාන්තයේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම මෙම වසර තුළ ඉටුකර ඇත.

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් පිහිටුවා ඇති විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා මෙහෙයවීම් කටයුතු මෙම අමාත්‍යාංශය මඟින් සිදුවන අතර දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව 15කි. මෙම වසර තුළ අම්පාර හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන දෙකක් විවෘත කර ඇත. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රධාන ප්‍රභේද තුනකින් සමන්විත වන අතර ඒවා කෘෂි නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් තොග මධ්‍යස්ථාන, කෘෂි නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග/ සිල්ලර වශයෙන් බෙදාහැරීමේ මධ්‍යස්ථාන, නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සිල්ලර අලෙවි මධ්‍යස්ථාන වශයෙන් බෙදී ඇත. 2017 වසරේ අයවැය ප්‍රතිපාදන හා කළමනාකරණ භාර අරමුදල් යොදවමින් ආර්ථික මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කර ඇත.

වී මිලදී ගැනීමේ ජාතික වැඩසටහන මෙහෙයවීමද මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රධාන විෂයය ක්ෂේත්‍රයකි. වී අලෙවි මණ්ඩලය 2007 වසරේ නැවත ආරම්භ කිරීමෙන් පසු රජයේ අපේක්ෂාව වූයේ වී නිෂ්පාදන කාර්යයේ නියුතු ගොවි මහතුන්ට තම ආර්ථික තත්ත්වය ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා සහතික මිල ක්‍රමයක් ඇති කිරීමත්, වී නිෂ්පාදන එම සහතික මිලට මිලදී ගැනීමත්, පාරිභෝගික ජනතාවට වඩාත් සාධාරණ මිලට සහල් වෙළෙඳපොළක් ඇති කිරීමත්ය. මේ යටතේ, වී අලෙවි මණ්ඩලය මඟින් වී මිලට ගැනීම, විකිණීම, සහල් බවට පත්කිරීම සහ සහල් සැපයීමේ හා බෙදාහැරීමේ කටයුතු ඉටු කර ඇත.

මේ අනුව ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක වන මෙම අමාත්‍යාංශයේ කාර්යයභාරය 2017 වසර තුළ මනා මුල්‍ය කළමනාකාරීත්වයකින් යුතුව විධිමත්ව ඉටු කිරීමට හැකි වී ඇත.

# 9. අමාත්‍යාංශය මඟින් 2017 වසර තුළ ඉටුකළ වැඩසටහන්

## 9.1 දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන

### 9.1.1 ගුණාත්මක කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගව නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ඉහළ කිරි නිෂ්පාදනයක් පවතින ප්‍රදේශ වල ගුණාත්මක කිරි නිෂ්පාදනය කෙරෙහි බලපානු ලබන එක් හේතුවක් වනුයේ බුරුලු ප්‍රදාහය නම් රෝගී තත්ත්වය වේ. ගව ගාලෙහි බිම නිසි ලෙස සකස් කිරීම මඟින් මෙම රෝගී තත්ත්වය ඇති වීමට ඇති හැකියාව අවම කර ගත හැක.

එම නිසා ගව නිවාසයේ බිමෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහි දී එක් ගොවිපළක් සඳහා උපරිමය රු. 30,000.00 කට යටත්ව 50% සහනාධාරයක් ගව නිවාසයේ බිම කොන්ක්‍රීට් කිරීම සඳහා ලබා දෙනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණ සහ ඌව පළාත්හි දිස්ත්‍රික් මට්ටමින් කිරි ගොවිපළ 480 ක් සංවර්ධනය කිරීම ඉලක්කය විය. 2017 වර්ෂය අවසාන වන විට ඉන් ව්‍යාපෘති 460 ක් ක්‍රියාත්මක කරන ලදී.

### 9.1.2. කුඩා පරිමාණ කිරි ගොවිපළ සංවර්ධනය

කුඩා පරිමාණ කිරි ගොවිපළ වල ඵලදායීතාවය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන අතර මෙමඟින් නිෂ්පාදිත කිරි සඳහා ඉහළ මිලක් ලැබීමෙන් කිරි ගොවියාගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ද සිදුවේ.

මෙම ව්‍යාපෘතිය තුළින් ගුණාත්මක බවින් ඉහළ කිරි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන යෙදවුම් එනම් කිරි දෙවීමේ යන්ත්‍ර, උසස් ආරයේ කිරි දෙනුන්, තෘණ කැබලි කරන යන්ත්‍ර ආදිය ලබා ගැනීම සඳහා රු. 60,000 ක උපරිමයකට යටත්ව 50% සහනාධාරයක් ලබා දේ. එසේම මෙම ව්‍යාපෘති පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක වන අතර, 2017 වසර සඳහා ප්‍රතිලාභීන් 360 ක් ඉලක්කගත කර තිබුණි. එයින් ප්‍රතිලාභී ගොවිපළ 328 ක් සඳහා අදාළ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරන ලදී.





### 9.1.3 දිළිඳු බව තුරන්කිරීම උදෙසා කාන්තා මූලික පවුල් සඳහා එළ ගවයින් බෙදාදීමේ ව්‍යාපෘතිය

පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලී සිටින බහුතරයක් සුළු පරිමාණ කිරි ගොවීන් වන අතර ඒ සඳහා වැඩි ශ්‍රම දායකත්වයක් ලබා දෙන්නේ කාන්තාවන්ය . එම කාන්තාවන් සවිබල ගැන්වීම දිළිඳුකම තුරන් කිරීම සඳහා ද මනා පිටුවහලක් වේ. එබැවින් මෙම ව්‍යාපෘතිය යටතේ දිවයිනේ යාපනය, කිලිනොච්චි, කුරුණෑගල, පොළොන්නරුව, කළුතර, මොණරාගල, මාතර, මාතලේ, රත්නපුර සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි කාන්තාවන් මූලිකත්වය ගෙන සිදුකරනු ලබන කිරි ගොවිපළ සඳහා රු. 60,000.00 ක උපරිමයකට යටත්ව 50% ක සහනාධාර පදනම මත උසස් ආරයේ කිරි දෙනකු ලබා දෙනු ලැබේ.

පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තු හරහා ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂය සඳහා ප්‍රතිලාභීන් ගොවිපළ 100 ක් ඉලක්කගත කර තිබුණු අතර, කාන්තා මූලික ප්‍රතිලාභී ගොවිපළ 79 ක් සඳහා ප්‍රතිපාදන නිකුත් කර ඇත.

### 9.1.4 කිරි එකතු කිරීමේ ජාලය සවිබල ගැන්වීම

මේ වන විට කිරි නිෂ්පාදනය ඉහළ නංවා ඇති නමුත් නිශ්චිත හා ශක්තිමත් කිරි එකතු කිරීමේ ජාලයක් නොමැති වීම ප්‍රධාන බාධකයකි. එබැවින් මේ යටතේ අමාත්‍යාංශය හා මිල්කෝ සමාගම ඒකාබද්ධව කිරි නිෂ්පාදනය ඉහළ ප්‍රදේශ වල කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම සිදු කෙරේ. මේ යටතේ 2017 වර්ෂයේදී නව කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 03 ක් ස්ථාපිත කිරීම සඳහා ලීටර් 5,000 ක ධාරිතාවයෙන් යුතු කිරි ශීත කිරීමේ ටැංකි 03 ක් මිල්කෝ (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇත.

## 9.2. අභිජනන ගොවිපල පිහිටුවීමේ වැඩසටහන

### 9.2.1. අභිජනන ගොවිපළ පිහිටුවීම

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීමේ අරමුණ ඇතිව දිවයින පුරා පළාත් මට්ටමින් අභිජනන ගොවිපළ පිහිටුවීම සිදු කරන ලදී. ඒ අනුව 2017 වසර තුළ සත්ත්ව අභිජනන ගොවිපළ 200 ක් පිහිටුවීමට සැලසුම් කරන ලද අතර ඒ වෙනුවෙන් රු.මිලියන 20ක් වෙන් කරන ලදී . වර්ෂ අවසානයේ දී අභිජනන ගොවිපළ 207 ක ඉදිකිරීම් කටයුතු සාර්ථකව අවසන් කර ඇත. එමගින් අභිජනනය සඳහා සුදුසු සතුන් මිලදී ගැනීම සහ ගවගාල් සාදා දීම සිදු කළ අතර, ඒ වෙනුවෙන් රු.මිලියන 20.7 ක මුදලක් වැය කර ඇත.

***2017 වසර තුළ ක්‍රියාත්මක අභිජනන ගොවිපළ සංඛ්‍යාව***

| *පළාත* | *අභිජනන ගොවිපළ* | |
|---|---|---|
| | *සංඛ්‍යාව* | *වැය කල මුදල* |
| *මධ්‍යම* | *36* | *3.6* |
| *නැගෙනහිර* | *09* | *0.9* |
| *උතුර* | *30* | *3.0* |
| *උතුරු මැද* | *24* | *2.4* |
| *වයඹ* | *43* | *4.3* |
| *සබරගමුව* | *08* | *0.8* |
| *දකුණ* | *16* | *1.6* |
| *ඌව* | *31* | *3.1* |
| *බස්නාහිර* | *10* | *1.0* |
| ***එකතුව*** | ***207*** | ***20.7*** |





පසුගිය වර්ෂ තුළ ක්‍රියාත්මක කරනු ලැබූ අභිජනන ගොවිපළ

**9.2.2 මිල්කෝ සමාගමේ කිරි සැපයුම්කරුවන්ට තෘණ සංරක්ෂණය කිරීම සඳහා උපකරණ ලබා දීම.**

2017 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 05 ක මුදලක් වෙන් වූ අතර මේ යටතේ සයිලේජ් නිපදවීම සඳහා වැඩි විභවයක් ඇති දිස්ත්‍රික්ක කිහිපයක් තෝරා ප්‍රතිලාභින් 50 දෙනෙකු සඳහා මෙම ප්‍රතිපාදන ලබා දෙන ලදී. එක් ප්‍රතිලාභියෙකු සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය ඇතිව අමාත්‍යාංශ උපරිම දායකත්වය රු. 100,000/= (මුළු මුදල රු.200,000/=) වන සේ සයිලේජ් සෑදීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට මෙම ව්‍යාපෘතිය යටතේ කටයුතු කරන ලදී.





**9.2.3. ශ්‍රී ලංකාවේ බැටළු කර්මාන්තය නැංවීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට බැටළුවන් ආනයනය කිරීම.**

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.මිලියන 10 ක මුදලක් වෙන් කරන ලද අතර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අභිජනනය සඳහා සුදුසු පිරිමි බැටළුවන් 25 දෙනෙකු හා ගැහැණු බැටළුවන් 100 දෙනෙකු ආනයනය කිරීමට සැලසුම් කරන ලදී. නමුත් ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ තාක්ෂණික ගැටළු හේතුවෙන් 2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය යාවත්කාලීන කිරීමට සිදු විය.

## 9.3. පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන (උතුරු පළාත)

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත කාලසීමාව තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

| *ක්‍රියාකාරකම* | *භෞතික ප්‍රගතිය* | *මූල්‍ය ප්‍රගතිය* |
|---|---|---|
| **මන්නාරම දිස්ත්‍රික්කය මාන්තායි බටහිර පශු වෛද්‍ය නිල නිවාසය ඉදිකිරීම. (අවිච්ඡේද මුදල්)** | 100 % | 1,837,709.72 |
| **මුලතිව් දිස්ත්‍රික්කය මාන්කුලම් මුලතිව් තනිකඩ නිල නිවාසය ඉදිකිරීම. (අවිච්ඡේද මුදල්)** | 100 % | 2,980,303.74 |
| **කිලිනොච්චි අරියනගර් පශු සම්පත් පුහුණු පාසලේ ද්විත්ව නිල නිවාසය ඉදිකිරීම. (අවිච්ඡේද මුදල්)** | 100 % | 2,107,425.40 |
| **මන්නාරම දිස්ත්‍රික්කය මඩු පශු වෛද්‍ය නිල නිවාසය ඉදිකිරීම.** | 50 % | 3,091,491.63 |
| **මුලතිව් දිස්ත්‍රික්කය මුලතිව් පුතුකුඩුඉරිප්පු පශු වෛද්‍ය නිල නිවාසය ඉදිකිරීම.** | 95 % | 7,200,000.00 |
| **මුලතිව් දිස්ත්‍රික්කය තුනුක්කායි ගොවිපළේ පශු වෛද්‍ය නිල නිවාසය ඉදි කිරීම.** | 95 % | 9,480,000.00 |
| **උතුරු පළාත් පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව පාලන පුහුණු ආයතන හා සත්ත්ව ගොවිපළ සඳහා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම.** | 100 % | 5,938,051.58 |




කිලිනොච්චිය පශු සම්පත් පාසලේ ද්විත්ව නිල නිවාසය



මන්නාරම දිස්ත්‍රික් මාන්තායි බටහිර පශු වෛද්‍ය නිල නිවාසය

## 9.4. කිරි ගවයින් ආනයනය කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන 2016 වසර තුළදී සම්පූර්ණ කරනු ලැබූ අතර 2017 වසර තුළ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සමාලෝචන සඳහා මෙහෙයුම් කමිටු රැස්වීම් 03ක් පවත්වා අදාළ අංශ වෙත උපදෙස් ලබාදීම සිදු කර ඇත.

## 9.5. සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන

මේ යටතේ නව ව්‍යවසායකයින් කුකුළු පාලන ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමත්, දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් සිදු කරන අතර බිත්තර, කුකුළු මස් හා සත්ත්ව ආහාර නිෂ්පාදනය මෙන්ම කුකුළු පැටවුන් නිෂ්පාදනය ප්‍රචලිත කිරීමත් අපේක්ෂා කෙරේ. සෑම පුද්ගලයෙකුටම සතියකට බිත්තර 3ක් සහ වසරකට කුකුළු මස් කිලෝ ග්‍රෑම් 10ක් පරිභෝජනය කිරීමට හැකිවන පරිදි කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

2017 වසර තුළ දී සුළු පරිමාණ කුකුළු ගොවිපොළ පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ගොවිපළ 1,722ක් පිහිටුවා ඇත. මෙයට අමතරව දිළිඳුකම නිදහස් කිරීමේ වැඩසටහනට සමගාමීව වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මහවැව පශු වෛද්‍ය කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 100 දෙනෙකු සඳහා ද පුත්තලම දිස්ත්‍රික්කයේ විශේෂ වැඩසටහනක් ලෙසින් තවත් ප්‍රතිලාභින් 330 ක් වෙත සුළු පරිමාණ කුකුළු ගොවිපළ පිහිටුවීම අරමුණ කරගෙන කිකිළි පැටවුන් 10 බැගින් ලබා දී ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 8.337ක ප්‍රතිපාදන යොදා ගන්නා ලදී.

මෙම වසර තුළ කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර 12 ක් ස්ථාපනය කිරීම, කුඩා පරිමාණ මස් සකස් කිරීමේ මධ්‍යස්ථාන 20 ක් ස්ථාපනය කිරීම, බිත්තර රක්කනාගාර ස්ථාපනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 5.062ක ප්‍රතිපාදන යොදා ගන්නා ලද අතර බස්නාහිර පළාත තුළ ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.









සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපල සංවර්ධනය ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ දී 50% සහනාධාරය යටතේ ලබා දෙන ලද සත්ත්ව ආහාර මිශ්‍රණ හා කුකුළු මස් සැකසුම් යන්ත්‍ර



වාරියපොල පශු වෛද්‍ය කොට්ඨාශයේ
ඒ.එම්.ජී අතපත්තු මහතා



කොබෙයිගනේ පශු වෛද්‍ය කොට්ඨාශයේ
ඩී.එම්.ජේ. දිසානායක මහතා





කොබෙයිගනේ පශු වෛද්‍ය කොට්ඨාශයේ
කොට්ඨාශයේ
කේ.එම්. කාමිල් මහතා

කොබෙයිගනේ පශු වෛද්‍ය
ඒ.පී.එම්. පවුදර් මහතා

## 9.6. සූකර සංවර්ධන වැඩසටහන

2017 වසර තුළදී රුපියල් මිලියන 3.637 ක ප්‍රතිපාදන යොදා ගනිමින් බස්නාහිර, වයඹ, මධ්‍යම, නැගෙනහිර, උතුරු මැද, උතුරු හා දකුණු පළාත තුළ දැනට පවතින කුඩා පරිමාණ සූකර ගොවිපොළ 73ක් පරිසර හිතකාමී තත්ත්වය සංවර්ධනය කර ඇත.

මෙම වසරේ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 6ක් ආයෝජනය කරමින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත පූර්ව මව් පිය පරම්පරාවේ සූකර සතුන් ආනයනය සඳහා කටයුතු කළ නමුත් මේ වන විට සූකර මාංශ සඳහා වන වෙළෙඳපොළ බිඳවැටීම මත එම කාර්ය නැවත සමාලෝචනය කිරීමට සිදුවූ අතර අභිජනන සූකර සතුන් ආනයනය වෙනුවට අධි ශීතකරණ ලද උසස් ආරයේ සූකර ශුක්‍ර ආනයනයට කටයුතු කරමින් පවතින අතර 2018 වර්ෂයේ ප්‍රතිපාදන යොදා ගනිමින් එම ශුක්‍ර ආනයනය කිරීමට අපේක්ෂා කෙරේ.





## 9.7. බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

මිල්කෝ (පුද්ගලික) සමාගමට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි කිරි සැකසුම් කර්මාන්ත ශාලාව වෙනුවෙන් නව කිරි කර්මාන්ත ශාලාවක් ගම්පහ දිස්ත්‍රික්කයේ බඩල්ගම ප්‍රදේශයෙහි පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපළෙහි ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඩෙන්මාර්ක් රජයේ සහයෝගීතාව මත ක්‍රියාත්මක වන අතර කිරි කර්මාන්ත ශාලා ගොඩනැඟිල්ලේ ඉදි කිරීම් කටයුතු 78% පමණ ද, පරිපාලන හා කාර්යාල ගොඩනැඟිල්ල 95% ද, ආපන ශාලා ගොඩනැඟිල්ල 80% ද, අප ජල කළමනාකරණ ඒකකයෙහි 85% ක් සහ විදුලි ජනන ඒකකය ස්ථාපිත කිරීමේ කටයුතු වලින් 95% ක් 2017 වර්ෂය අවසන් වන විට සම්පූර්ණ කර ඇත. ව්‍යාපෘතිය සඳහා යන්ත්‍රෝපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයේදී ගිවිසුම් ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතු බදු මුදල් ප්‍රතිපූර්ණය වෙනුවෙන් දේශීය අරමුදල් වශයෙන් ලබාදුන් රුපියල් මිලියන 299 ක ප්‍රතිපාදන වැය කර ඇත. කර්මාන්ත ශාලාව ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 2,169 ක වටිනාකමින් යුතු යන්ත්‍රෝපකරණ කොටස් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය බහාලුම් 32 ක් සමාලෝචිත කාලසීමාව තුළ එනම් 2017 වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා ආනයනය කර ඇත.









## 9.8. දැනුම වර්ධනය කිරීම තුළින් කිරි නිෂ්පාදනය සඳහා වන ව්‍යාප්ති සේවා සවිබලගැන්වීම

මෙම ව්‍යාපෘතිය යටතේ බෙලරුස් රාජ්‍යයේ කෘෂිකර්ම විශ්ව විද්‍යාලයේ කිරි ගව පාලනය සම්බන්ධයෙන් සති 06 ක පුහුණුවක් සඳහා නිලධාරීන් දස දෙනෙකුට අවස්ථාව සැලසී ඇත. ශ්‍රී ලංකා සහ බෙලරුස් රාජ්‍යයන් අතර සහයෝගීතාව සඳහා වන එකඟතා ගිවිසුම් මේ වන විට සකසා අවසන් කර ඇත.

මෙම එකඟතා ගිවිසුම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය මේ වන විට ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලැබී ඇත. තවද මෙම පුහුණුව සඳහා සහභාගී වීමට සුදුසු පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාම යෝජනා පළාත් මට්ටමින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

## 9.9. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කොට ගෙන ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන අංශ තුනක් යටතේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ.

### 9.9.1. කුඩා පරිමාණ කිරි ගොවිපොළ සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනෙහි ප්‍රතිපාදන යටතේ කුඩා පරිමාණ කිරි ගොවිපළවල ගුණාත්මක කිරි නිෂ්පාදනය දිරි ගැන්වීම අරමුණු කොටගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. එක් ප්‍රතිලාභියෙකු වෙත රුපියල් 60,000 ක උපරිමයකට යටත්ව සියයට 50ක සහනාධාර මුදලක් මේ යටතේ නිකුත් කෙරේ. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මෙන්ම මිල්කෝ (පුද්ගලික) සමාගම හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ 2017 වර්ෂය තුළ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හරහා ව්‍යාපෘති 433 ක් සහ මිල්කෝ (පුද්ගලික) සමාගම හරහා ව්‍යාපෘති 400 ක් ක්‍රියාත්මක කොට ඇත. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 50.00 ක් යොදවා ඇත.




### 9.9.2.කුඩා පරිමාණ එළු ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය

කුඩා පරිමාණ එළු පාලනයේ නියුතු ප්‍රතිලාභීන්ගේ ආර්ථිකය නගා සිටුවීම හා දේශීය එළු කිරි හා එළු මස් නිෂ්පාදනය ඉහළ නංවා ජනතාවගේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ,ගොවිපොළවල් 330 ක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 20 ක් ආයෝජනය කර ඇත. මෙහිදී එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් පිරිමි සතෙකු හා ගැහැණු සතුන් 04 ක් හෝ ගැහැණු සතුන් 05 ක් මිලට ගැනීම සඳහා රු.60,000 ක මුදලක් ලබාදෙන ලදී. වර්ෂ අවසාන වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 321 ක් සාර්ථකව නිමා කර ඇති අතර, ඒ සඳහා රු.මිලියන 19.152 ක මුදලක් වැය කර ඇත.





### 9.9.3. කුඩා පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය කිරීමේ වැඩසටහන

කුකුළු නිෂ්පාදන සංවර්ධනය සඳහා ගෘහස්ත මට්ටමේ දායකත්වය ලබාදීම තුළින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, එක් ප්‍රතිලාභියෙකු වෙත මසක් වයසැති කිකිළි පැටවුන් 10 බැගින් ලබාදීම සිදුවේ. ප්‍රතිලාභීන් විසින් ඔවුන්ගේ ව්‍යාපෘති දායකත්වය ලෙසින් කුකුළු නිවාසය සාදාගැනීම හා සතුන් සඳහා අවශ්‍ය ආහාර ලබා දීම සිදුකළ යුතුය. මේ සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර 2017 වසරේ දී සුළු පරිමාණ කුකුළු ගොවිපොළ 7911 ක් දීප ව්‍යාප්තව ස්ථාපනය කිරීම සිදුකළ අතර, මේ වෙනුවෙන් රුපියල් මිලියන 29.629 ක ප්‍රතිපාදන යොදා ගන්නා ලදී.









## 9.10. ජාන වැඩි දියුණු කිරීම තුළින් මී ගව කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාව තුළ මී ගව පාලනය නිදැලි, අඩ නිදැලි හා  සූක්ෂම ක්‍රමයට සිදු කරන අතර, ජාන සංයුතිය වැඩි දියුණු කිරීමෙන් මී ගවයින්ගේ ඵලදායීතාවය ඉහළ නැංවීමට හැකි වේ. ස්වාභාවිකවම මී ගවයින්ගේ මද ලක්ෂණ නිරීක්ෂණයට ඇති අපහසුතාවය හේතුවෙන් කෘත්‍රිම සිංචනය සිදු කිරීමද අපහසු වී ඇත. එම නිසා තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක තෝරාගත් ගොවීන් සඳහා ජාන වැඩි දියුණු කිරීම තුළින් මී ගව කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන උසස් ආරයේ පට්ටි වස්සෙකු සහනාධාර පදනම මත ලබා දීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුවිය.

මෙහිදී තෝරාගත් දිස්ත්‍රික්ක 10 ක, එක් දිස්ත්‍රික්කයක ප්‍රතිලාභී ගොවිපළ 5 ක් ලෙස ගොවිපළ 50 ක් සඳහා පට්ටි වස්සෙකු, 50% සහනාධාර මත උපරිමය රු. 80,000.00 ට ලබා දීම සිදු කරනු ලැබීය.  මේ සඳහා රු. මිලියන 4.1 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි.

2017 වර්ෂයේ ගොවිපළ 48 ක් සඳහා ප්‍රතිලාභ ලබා  දී ඇති අතර, ඒ සඳහා රු. මිලියන 3.473 ක් වැය වී ඇත.





## 9.11. කිරි ගවයින් 20,000 ක් ආනයනය කිරීම

දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් උසස් ආරයේ ගැබ්බර කිරි දෙනුන් ඕස්ට්‍රේලියාවෙන් හා නවසීලන්තයෙන්  ආනයනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබේ. කිරි ගව පාලනයේ නිරතවන මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසායකයින් වෙත මෙම එළදෙනුන් ලබා දී වඩා කාර්යක්ෂම හා ගුණාත්මක කිරි නිෂ්පාදනයක් ඇති ගොවිපොළවල් දීපව්‍යාප්තව පිහිටුවීමට අපේක්ෂිතය. මෙම සතුන්ගෙන් ජනිත වන පළමු පරම්පරාවේ පැටවුන් කුඩා පරිමාණ කිරි ගොවීන්ට ලබා දීමට සහ දේශීය ආරයන් වැඩි දියුණු කරගැනීම සඳහා දායක කර ගැනීමටද අපේක්ෂිතය.

ඒ යටතේ 2017 වර්ෂයේ දී කිරි ගවයින් 5,000 ක් නවසීලන්තයෙන් හා ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද අතර, එම සතුන් කුරුණෑගල, බදුල්ල, නුවරඑළිය, මාතලේ හා නුවර යන දිස්ත්‍රික්ක පහක ආයෝජිකයින් වෙත ලබා දී ඇත. දෙසැම්බර් මාසයේ දී මෙම ගොවිපළවල දෛනික කිරි නිෂ්පාදනය ලීටර 22,000 කි.





## 9.12. නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පෞද්ගලික කෘත්‍රිම සිංචන තාක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම

පෞද්ගලික කෘත්‍රිම සිංචන තාක්ෂණ නිලධාරීන් ලෙස 50 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කළ අතර, ඒ අනුව තෝරාගත් නිලධාරීන් අදියර දෙකක් යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි පොළොන්නරුව පිහිටි කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේදී පුහුණුවීම් කටයුතු අවසන් කර ඇත. තවද පුහුණුවෙන් පසු අදාළ කෘත්‍රිම සිංචන පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීම 2017 වර්ෂය තුළ සිදු කර ඇත.

## 9.13 අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය මගින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කරන ලද කාර්යභාරය

ග්‍රාමීය ජනතාව ආර්ථිකව නගාසිටුවීම සඳහා ග්‍රාමිය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධනය අරමුණු කර ගනිමින් අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය මගින් සමාලෝචිත වර්ෂයේදී දේශීය අරමුදල් භාවිතා කරමින් ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ලැබුණු ප්‍රතිපාදන යොදවමින් තෝරාගත් දිස්ත්‍රික්ක 10ක ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2017 ක්‍රියාත්මක කර ඇත. තවද, කෘෂි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ මිල ස්ථායීකරණය හා ඒවායේ පසු අස්වනු හානිය අවම කිරීම ඉලක්ක කරගනිමින් දඹුල්ල හා කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්ට ආසන්නව ශීතාගාර පහසුකම් ඉදිකිරීම/ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක්ද අරඹා ඇත. දැනට පවතින විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වවුනියාවේ සහ මඩකලපුවේ නව ආර්ථික මධ්‍යස්ථාන දෙකක් ඉදිකිරීම් කටයුතු අරඹා ඇත.

## 9.14 ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති

### 9.14.1 කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය

වාණිජමය වශයෙන් විභවයක් ඇති කිතුල් නිෂ්පාදන කර්මාන්තය සඳහා දේශීය හා විදේශීය වශයෙන් විශාල ඉල්ලුමක් පවතී. කිතුල් සංවර්ධන කර්මාන්තය කළුතර, රත්නපුර, බදුල්ල, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ. මෙම කර්මාන්තය සංවර්ධනය කිරීම මගින් ග්‍රාමීය ජනතාවගේ ස්වයං රැකියා අවස්ථා වැඩිදියුණු වීම, කිතුල් කාර්මිකයන් සහ ව්‍යවසායකයින් සඳහා ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැංවීම, දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ සඳහා ගුණාත්මක කිතුල් නිෂ්පාදන ප්‍රචලිත කිරීම, කිතුල් ආශ්‍රිත නිර්මාණ විවිධාංගීකරණය සහ කිතුල් කර්මාන්තය ආශ්‍රිතව පවතින වෙළෙඳපොළ ගැටළු හා නීතිමය ගැටළු අවම කර ගැනීම සඳහා අවධානය යොමු වී ඇත.

කිතුල් කර්මාන්තය සිදු කරනු ලබන දිස්ත්‍රික්ක 12 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58 ක හඳුනාගත් කිතුල් කාර්මිකයන්, ශිල්පීන් හා ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම, තාක්ෂණය ලබාදීම, නව නිෂ්පාදන හඳුන්වාදීම සහ ගුණාත්මක නිෂ්පාදන සඳහා ඔවුන් දිරි ගැන්වීම තුළින් ආදායම් මට්ටම ඉහළ නැංවීමට විවිධ පියවරයන් ගෙන ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගනු ලබන කිතුල් කර්මාන්තකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් ලබාදීම සඳහා පහසු ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

සමාලෝචිත වර්ෂයේදී කිතුල් ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදුන් අතර, දිස්ත්‍රික් මට්ටමින් කිතුල් අලෙවි සැල් ස්ථාපිත කිරීම, කිතුල් පැණි, හකුරු හා ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම, ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක නිෂ්පාදන වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇත.

කිතුල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සිදු කරන ලද මැදිහත්වීම් පහත පරිදි වේ.

- කිතුල් කාර්මිකයින් සහ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා ප්‍රදර්ශන පැවැත්වීම.
- කිතුල් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීමට අරමුදල් සැපයීම.
- රක්ෂිත වනාන්තරවල කිතුල් මල් මැදීමේ හැකියාව සම්බන්ධව කිතුල් කාර්මිකයින් දැනුවත් කිරීම.
- කිතුල් ආශ්‍රිත ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීම.
- කිතුල් කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, භාණ්ඩ හා උපකරණ ලබාදීම.
- කිතුල් දැව ආශ්‍රිත නිර්මාණකරුවන් දිරි ගැන්වීම.

2017 වසරේදී කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 25 ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 12 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58 ක ප්‍රතිලාභීන් 2,100 දෙනෙකු සඳහා සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

***කිතුල් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය - 2017 (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව)***

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභ ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | තාක්ෂණික පුහුණුව සඳහා (රු.) | උපකරණ ලබාදීම සඳහා (රු.) | වෙනත් (රු.) | මුළු ප්‍රතිපාදන (රු.) |
|---|---|---|---|---|---|---|
| ගාල්ල | නියාගම,නාගොඩ,නෙළුව, තවලම | 73 | 80,000 | 885,000 | - | 1,179,905 |
| මාතර | පස්ගොඩ,පිටබැද්දර,මාලිම්බඩ, වැලිපිටිය,තිහගොඩ,අතුරලිය කඹුරුපිටිය | 363 | 200,000 | 2,455,000 | 15,000 (කිතුල් පැල දීම) | 2,710,050 |
| කළුතර | වලල්ලාවිට,අගලවත්ත ඉංගිරිය, බුලත්සිංහල | 186 | 100,000 | 1,300,000 | - | 1,428,865 |
| කුරුණෑගල | පොල්පිතිගම,රිදීගම, මාවතගම, කොටවෙහෙර | 84 | 100,000 | 1,020,000 | - | 1,141,032 |
| මාතලේ | යටවත්ත,ලග්ගල පල්ලේගම අඹන්ගඟකෝරළේ,මාතලේ | 133 | 100,000 | 1,415,000 | 10,000 (කිතුල් පැල දීම) | 1,556,430 |
| පොළොන්නරුව | ලංකාපුර | 30 | 20,000 | 300,000 | 50,000 (කිතුල් පැල දීම) | 377,630 |
| බදුල්ල | හල්දුම්මුල්ල,සොරණාතොට, හපුතලේ,ඇල්ල,පස්සර ඌවපරණගම,මහියංගනය රිදීමාලියද්ද,බදුල්ල | 311 | 190,000 | 4,260,000 | 300,000 (ජංගම අලෙවි කුටි) | 4,847,941 |
| මහනුවර | දෙල්තොට,උඩදුම්බර, පාතදුම්බර, උඩුනුවර, ගඟඉහළකෝරළේ, යටිනුවර,තෙල්දෙණිය, පස්බාගේකෝරළේ, නාවලපිටිය,මිනිපේ,පූජාපිටිය | 375 | 240,000 | 4,670,000 | 5,000 (කිතුල් පැල දීම) | 5,016,330 |
| රත්නපුර | කිරිඇල්ල,කලවාන,අයගම, කුරුවිට,බලන්ගොඩ, රත්නපුර,ඇහැළියගොඩ | 241 | 175,000 | 2,055,000 | 50,000 (ජංගම අලෙවි කුටි) | 2,517,010 |
| නුවරඑළිය | කොත්මලේ,හඟුරන්කෙත | 144 | 90,000 | 1,480,000 | 70,000 (කිතුල් පැල දීම) | 1,673,815 |
| කෑගල්ල | මාවනැල්ල,අරණායක, යටියන්තොට,රඹුක්කන | 140 | 120,000 | 2,300,000 | - | 2,469,895 |
| හම්බන්තොට | ඕකෙවෙල | 20 | 20,000 | 20,000 | - | 40,825 |
| **එකතුව** | **58** | **2,100** | **1,435,000** | **22,160,000** | **500,000** | **24,959,728** |

සමාලෝචිත වසරේදී ක්‍රියාත්මක කළ කිතුල් සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය 2017.12.31 දිනට පහත පරිදි වේ.

***කිතුල් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2017***

| *දිස්ත්‍රික්කය* | *මූල්‍ය ප්‍රගතිය (රු.)* | *භෞතික ප්‍රගතිය* |
|---|---|---|
| *ගාල්ල* | *1,172,100* | *ප්‍රතිලාභීන් 125ක් සඳහා පුහුණු වැඩසටහන් 09ක් පවත්වා උපකරණ ලබා දී ඇත. අලෙවි ප්‍රදර්ශන 02ක් පවත්වා ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මාතර* | *2,695,000* | *ප්‍රතිලාභීන් 360ක් සඳහා පුහුණු වැඩසටහන් 16ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *කළුතර* | *1,428,360* | *ප්‍රතිලාභීන් 180ක් සඳහා පුහුණු වැඩසටහන් 08ක් පවත්වා උපකරණ ඇණවුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *කුරුණෑගල* | *1,140,432* | *ප්‍රතිලාභීන් 132ක් සඳහා පුහුණු වැඩසටහන් 06ක් පවත්වා ඇති අතර, උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මාතලේ* | *1,440,000* | *ප්‍රතිලාභීන් 135ක් සඳහා පුහුණු වැඩසටහන් 10ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *පොළොන්නරුව* | *350,200* | *ප්‍රතිලාභීන් 135ක් සඳහා පුහුණු වැඩසටහන් 07ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *බදුල්ල* | *4,846,235* | *ප්‍රතිලාභීන් 335ක් සඳහා පුහුණු වැඩසටහන් 12ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මහනුවර* | *5,000,880* | *ප්‍රතිලාභීන් 375ක් සඳහා පුහුණු වැඩසටහන් 20ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *රත්නපුර* | *2,517,000* | *ප්‍රතිලාභීන් 220ක් සඳහා පුහුණු වැඩසටහන් 18ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *නුවරඑළිය* | *1,580,990* | *ප්‍රතිලාභීන් 145ක් සඳහා පුහුණු වැඩසටහන් 14ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *කෑගල්ල* | *2,459,000* | *ප්‍රතිලාභීන් 140ක් සඳහා පුහුණු වැඩසටහන් 10ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *හම්බන්තොට* | *40,000* | *ප්‍රතිලාභීන් 68ක් සඳහා පුහුණු වැඩසටහන්05 පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *එකතුව* | ***24,670,197*** | |



*කිතුල් අලෙවි ප්‍රදර්ශනය - ගාල්ල*



*මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැවති පුහුණු වැඩසටහනක්*

### 9.14.2. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයට රුපියල් මිලියන 28 ක ප්‍රතිපාදන දේශීය අරමුදල් මගින් ලබා දී ඇත. සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන් සඳහා නව තාක්ෂණික දැනුම ලබාදීම තුළින් නව නිර්මාණකරණයේ යෙදීම සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදීම, වෙළඳපොළ ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කළ නිෂ්පාදන අලෙවිය සඳහා යොමු කිරීම හා නවීන උපකරණ හඳුන්වාදීම, පාරම්පරික කර්මාන්ත හා ශිල්පීය කුසලතා සඳහා නව තාක්ෂණික වටිනාකමක් ලබාදීම, හස්ත කර්මාන්තවල නියුක්තවූවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළෙඳපොල අවස්ථා පුළුල් කිරීම මේ තුළින් බලාපොරොත්තු වේ.

දීපව්‍යාප්තව තෝරාගත් දිස්ත්‍රික්ක 24ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119 ක සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගනු ලැබූ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව, තාක්ෂණික දැනුම, අමුද්‍රව්‍ය, උපකරණ හා භාණ්ඩ ලබාදීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අරමුදල් ලබා දී ඇත. මේ යටතේ සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කරන ලද කර්මාන්ත පහත සඳහන් වේ.

| *සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධනය යටතේ හඳුනාගෙන ඇති ක්ෂේත්‍රයන්* | | | |
|---|---|---|---|
| *වෙස්මුහුණු නිෂ්පාදන* | *බතික් කර්මාන්තය* | *තවාසි බුරුසු නිෂ්පාදනය* | *පබළු ආශ්‍රිත අත්කම්* |
| *දැවමය අත්කම් භාණ්ඩ නිෂ්පාදන* | *පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන* | *පන් ගම්මාන සංවර්ධනය* | *බීරළු රේන්ද කර්මාන්තය* |
| *කම්මල් කර්මාන්තය* | *උණ ලී ආශ්‍රිත නිර්මාණ* | *ස්වර්ණාභරණ නිෂ්පාදනය* | *හණ කර්මාන්තය* |
| *ලී කැටයම් කර්මාන්තය* | *වේවැල් ආශ්‍රිත නිෂ්පාදන* | *මැටි ආශ්‍රිත නිෂ්පාදන* | *තල් ආශ්‍රිත නිෂ්පාදන* |
| *ලාක්ෂා කර්මාන්තය* | *වර්ණ කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන* | | |

2017 වසරේදී සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 28 ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 24ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 119 ක ප්‍රතිලාභීන් 3,100 දෙනෙකු සඳහා සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ* | *ගම්මාන සංඛ්‍යාව* | *ප්‍රතිලාභීන් සංඛ්‍යාව* | *මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)* |
|---|---|---|---|---|
| *කොළඹ* | *කඩුවෙල, රත්මලාන* | *5* | *47* | *694,020* |
| *කළුතර* | *හොරණ, මදුරාවල, කළුතර* | *3* | *109* | *760,360* |
| *රත්නපුර* | *ඕපනායක,පැල්මඩුල්ල,කොලොන්න,ඉඹුල්පේ, කුරුවිට* | *7* | *86* | *862,420* |
| *මාතලේ* | *නා උල, ගලේවෙල, උකුවෙල, රත්තොට පල්ලේපොල, යටවත්ත* | *6* | *105* | *1,060,420* |
| *අනුරාධපුර* | *ගල්නෑව, කහටගස්දිගිලිය, පලාගල, නොච්චියාගම, තිරප්පනේ, ඉපලෝගම, හොරොව්පතාන, නාච්චදූව ගලෙන්බිඳුණු වැව, මිහින්තලය, කැකිරාව* | *11* | *225* | *2,750,540* |

| | | | | |
|---|---|---|---|---|
| කුරුණෑගල | මාස්පොත, පඬුවස්නුවර බටහිර, පඬුවස්නුවර නැගෙනහිර, කුරුණෑගල, අඹන්පොළ නිකවැරටිය, කුලියාපිටිය නැගෙනහිර කුලියාපිටිය බටහිර, රස්නායකපුර, උඩුබද්දාව අලව්ව, මාවතගම, බමුණාකොටුව, රිදීගම | *15* | *408* | *2,755,655* |
| මොණරාගල | කතරගම, බුත්තල | *2* | *55* | *341,900* |
| ගම්පහ | බියගම, මීරිගම, මිනුවන්ගොඩ, කැළණිය | *6* | *120* | *1,240,040* |
| බදුල්ල | හල්දුම්මුල්ල | *1* | *35* | *112,270* |
| පුත්තලම | හලාවත, නවගත්තේගම, නාත්තන්ඩිය | *3* | *70* | *464,380* |
| කෑගල්ල | අරණායක | *2* | *75* | *479,690* |
| මහනුවර | පාතදුම්බර, දොළුව, පූජාපිටිය, අකුරණ මිනිපේ, පස්බාගේ කෝරළේ, උඩුනුවර | *8* | *168* | *1,541,130* |
| හම්බන්තොට | අම්බලන්තොට, තංගල්ල, කටුවන | *5* | *150* | *729,740* |
| මාතර | කිරින්ද පුහුල්වැල්ල, මාලිම්බඩ, පිටබැද්දර අකුරැස්ස, වැලිගම, වැලිපිටිය, දික්වැල්ල මුලටියන, දෙවිනුවර, කඩවත්සතර | *14* | *425* | *2,858,750* |
| පොළොන්නරුව | දිඹුලාගල | *1* | *30* | *255,155* |
| ගාල්ල | බෝපෙ පෝද්දල, කරන්දෙණිය, බළපිටිය යක්කලමුල්ල, අම්බලන්ගොඩ, බෙන්තොට ඇල්පිටිය, ඉමදූව, හබරාදූව, ගෝනපීනුවල, නියාගම, වැලිවිටිය, දිවිතුර දකුණ, තවලම,හික්කඩුව | *17* | *300* | *3,755,870* |
| මඩකලපුව | කෝරලේපත්තු බටහිර, කෝරලේපත්තු, මන්මුනායි උතුර,පෝරතිවුපත්තු, එරාවූර් නගරය, කෝරලෛයිපත්තු - කිරාන් | *7* | *150* | *3,184,320* |
| මන්නාරම | මඩු, මන්නාරම නගරය, මුසලි | *4* | *87* | *489,900* |
| ත්‍රිකුණාමලය | තම්පලගමම්, පදවි ශ්‍රී පුර, කන්තලේ, කඩවත් නගර් | *5* | *74* | *739,947* |
| අම්පාර | නාවිදන්වෙලි | *1* | *60* | *173,505* |
| යාපනය | කරෙෛනගර්, ඩෙල්ෆ්, කරවෙඩ්ඩි, කයිට්ස්, නල්ලූර්, උදවි, තෙලිප්පලි, පේදුරුතුඩුව, චන්කනෛයි, චාවකච්චේරි, යාපනය | *11* | *200* | *1,816,695* |
| වවුනියාව | වවුනියාව | *1* | *35* | *224,535* |
| නුවරඑළිය | වලපනේ, කොත්මලේ | *3* | *51* | *381,710* |
| මුලතිව් | පුදුකුඩිඉරිප්පු | *1* | *35* | *326,600* |
| එකතුව | | ***139*** | ***3,100*** | ***27,999,552*** |

සමාලෝචිත වසරේදී ක්‍රියාත්මක කළ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය 2017.12.31 දිනට පහත පරිදි වේ.

***සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2017***

| *දිස්ත්‍රික්කය* | *මූල්‍ය ප්‍රගතිය (රු.)* | *භෞතික ප්‍රගතිය* |
|---|---|---|
| *කොළඹ* | 678,741.00 | *ප්‍රතිලාභීන් 150ක් සඳහා පුහුණු වැඩසටහන් 09ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *කළුතර* | 748,962.00 | *ප්‍රතිලාභීන් 110ක් සඳහා පුහුණු වැඩසටහන් 07ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *රත්නපුර* | 855,120.00 | *ප්‍රතිලාභීන් 165ක් සඳහා පුහුණු වැඩසටහන් 08ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මාතලේ* | 1,030,845.00 | *ප්‍රතිලාභීන් 105ක් සඳහා පුහුණු වැඩසටහන් 06ක් පවත්වා ඇති අතර, උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *අනුරාධපුර* | 2,749,544.00 | *ප්‍රතිලාභීන් 225ක් සඳහා පුහුණු වැඩසටහන් 16ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *කුරුණෑගල* | 2,755,500.00 | *ප්‍රතිලාභීන් 490ක් සඳහා පුහුණු වැඩසටහන් 21ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මොණරාගල* | 335,630.00 | *ප්‍රතිලාභීන් 138ක් සඳහා පුහුණු වැඩසටහන් 08ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *ගම්පහ* | 1,229,230.00 | *ප්‍රතිලාභීන් 245ක් සඳහා පුහුණු වැඩසටහන් 12ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *බදුල්ල* | 110,703.00 | *ප්‍රතිලාභීන් 45ක් සඳහා පුහුණු වැඩසටහන් 03ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *පුත්තලම* | 450,405.00 | *ප්‍රතිලාභීන් 85ක් සඳහා පුහුණු වැඩසටහන් 05ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *කෑගල්ල* | 470,000.00 | *ප්‍රතිලාභීන් 70ක් සඳහා පුහුණු වැඩසටහන් 02ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මහනුවර* | 1,530,459.00 | *ප්‍රතිලාභීන් 170සඳහා පුහුණු වැඩසටහන් 10ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *හම්බන්තොට* | 719,260.00 | *ප්‍රතිලාභීන් 320ක් සඳහා පුහුණු වැඩසටහන් 16ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මාතර* | 2,845,248.00 | *ප්‍රතිලාභීන් 560ක් සඳහා පුහුණු වැඩසටහන් 22ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්ය.* |
| *පොළොන්නරුව* | 248,410.00 | *ප්‍රතිලාභීන් 105ක් සඳහා පුහුණු වැඩසටහන් 05ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *ගාල්ල* | 3,745,780.00 | *ප්‍රතිලාභීන් 390ක් සඳහා පුහුණු වැඩසටහන් 18ක් පවත්වා උපකරණ මිලදී ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මඩකලපුව* | 3,175,220.00 | *ප්‍රතිලාභීන් 322ක් සඳහා පුහුණු වැඩසටහන් 14ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මන්නාරම* | 477,312.00 | *ප්‍රතිලාභීන් 89ක් සඳහා පුහුණු වැඩසටහන් 05ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *ත්‍රිකුණාමලය* | 739,745.00 | *ප්‍රතිලාභීන් 74ක් සඳහා පුහුණු වැඩසටහන් 06ක් පවත්වා උපකරණ ඇණවුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *අම්පාර* | 166,899.00 | *ප්‍රතිලාභීන් 60ක් සඳහා පුහුණු වැඩසටහන් 02ක් පවත්වා උපකරණ ඇණවුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *යාපනය* | 1,813,960.00 | *ප්‍රතිලාභීන් 200ක් සඳහා පුහුණු වැඩසටහන් 14ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *වවුනියාව* | 218,689.00 | *ප්‍රතිලාභීන් 94ක් සඳහා පුහුණු වැඩසටහන් 05ක් පවත්වා උපකරණ ඇණවුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *නුවරඑළිය* | 381,647.00 | *ප්‍රතිලාභීන් 48ක් සඳහා පුහුණු වැඩසටහන් 04ක් පවත්වා උපකරණ ලබා දී ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *මුලතිව්* | 317,850.00 | *ප්‍රතිලාභීන් 60ක් සඳහා පුහුණු වැඩසටහන් 02ක් පවත්වා උපකරණ ඇණවුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන්* |
| *එකතුව* | ***27,795,159.00*** | |





කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් වෙත ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් අතින් භාණ්ඩ හා උපකරණ බෙදාදීමේ අවස්ථාවක්......





පෝරතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් වෙත ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් අතින් භාණ්ඩ හා උපකරණ බෙදාදීමේ අවස්ථාවක්......

### 9.14.3. මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම

ග්‍රාමීය මැටි නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත කාර්මිකයින් දිරිගැන්වීම,මැටි කර්මාන්තකරුවන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම, වෙළෙඳපොළ අරමුණු කර ගත් නිෂ්පාදන හඳුන්වාදීම තුළින් වෙළෙඳපොළ අවස්ථා වැඩි දියුණු කිරීම සහ අඩු ආදායම්ලාභී මැටි කර්මාන්තකරුවන් සඳහා උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 5ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා ලබා දී ඇත. මේ යටතේ හම්බන්තොට උඩුකිරිවිල ගම්මානය මැටි භාණ්ඩ නිෂ්පාදන ආදර්ශ ගම්මානයක් ලෙස වැඩි දියුණු කර ඇත. තවද, අනුරාධපුරය, කුරුණෑගල,මාතර,මහනුවර හා ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මැටි ගම්මාන ශක්තිමත් කිරීම සඳහා ආයෝජනයන් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකළ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- ❖ සාම්ප්‍රදායික මැටි වළං කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් සඳහා පුහුණුව ලබාදීම.
- ❖ මැටි කර්මාන්තකරුවන්ට නවීන තාක්ෂණය ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ❖ මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා මැටි අඹරන යන්ත්‍ර ලබාදීම.
- ❖ මැටි කර්මාන්තකරුවන් සඳහා විදුලි සකපෝරු ලබාදීම.
- ❖ මැටියෙන් තනන ලද ගැස් වළං නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර, උපකරණ හා අච්චු ලබාදීම.

- ❖ මැටි වළං ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා වෙළෙඳපොළ සහය ලබාදීම සඳහා අලෙවි මධ්‍යස්ථාන හඳුන්වාදීම
- ❖ මැටි කර්මාන්තකරුවන් අලෙවි ප්‍රදර්ශන වෙත යොමුකිරීම තුළින් ඔවුන් දිරිගැන්වීම

2017 වසරේදී මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 5 ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 06 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක ප්‍රතිලාභීන් 402 දෙනෙකු සඳහා සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

***මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම - 2017 (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්)***

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගම / ගම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | උසස් තාක්ෂණික පුහුණුව (රු.) | උපකරණ ලබාදීම (රු.) | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) |
|---|---|---|---|---|---|---|---|
| **1** | අනුරාධපුරය | මිහින්තලය | ඇලැපන්කුලම / කටුපොත | 50 | 15,000 | 200,000 | 219,433 |
| | | **උප එකතුව** | | **50** | **15,000** | **200,000** | **219,433** |
| **2** | කුරුණෑගල | ගනේවත්ත | තිත්තවැල්ල | 28 | - | 290,000 | 295,980 |
| | | පඩුවස්නුවර නැගෙනහිර | කෙලිනාවල | 30 | 10,000 | 900,000 | 928,760 |
| | | බිංගිරිය | ඌරාපොත්ත | 60 | 15,000 | 520,000 | 546,030 |
| | | පන්නල | වේරහැර | 60 | 15,000 | 200,000 | 219,430 |
| | | උඩුබද්දාව | නෙරළුගම | 20 | 15,000 | 245,000 | 265,360 |
| | | වීරඹුගෙදර | කණුමලේ | 40 | 20,000 | 500,000 | 530,720 |
| | | **උප එකතුව** | | **238** | **75,000** | **2,655,000** | **2,786,280** |
| **3** | මාතර | හක්මණ | දෙනගම බටහිර, ලාල්පෙ | 20 | 20,000 | 204,000 | 228,620 |
| | | තිහගොඩ | මැදඋයන්ගොඩ | 20 | 15,000 | 310,000 | 331,700 |
| | | **උප එකතුව** | | **40** | **35,000** | **514,000** | **560,320** |
| **4** | හම්බන්තොට | වීරකැටිය | උඩුකිරිවිල (වැවක් සමඟ ගමක්) | 34 | - | 1,016,600 | 1,037,560 |
| | | **උප එකතුව** | | **34** | **-** | **1,016,600** | **1,037,560** |
| **5** | මහනුවර | පාතදුම්බර | පණ්ඩිත ගම්මානය | 20 | 10,000 | 200,000 | 214,330 |
| | | **උප එකතුව** | | **20** | **10,000** | **200,000** | **214,330** |
| **6** | ගාල්ල | කරන්දෙණිය | ලේනගල්පලාත | 20 | - | 129,400 | 132,070 |
| | | **උප එකතුව** | | **20** | **-** | **129,400** | **132,070** |
| | | **එකතුව** | | **402** | **135,000** | **4,715,000** | **4,949,993** |

සමාලෝචිත වසරේදී ක්‍රියාත්මක කළ මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය 2017.12.31 දිනට පහත පරිදි වේ.

***මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය - 2017***

| දිස්ත්‍රික්කය | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| අනුරාධපුරය | **219,740.00** | ප්‍රතිලාභීන් 50ක් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා උපකරණ ලබා දී ඇත. (ගෑස් වළං යන්ත්‍ර) ව්‍යාපෘතිය අවසන්. |
| කුරුණෑගල | **2,732,089.00** | ප්‍රතිලාභීන් 250ක් සඳහා පුහුණු වැඩසටහන් 09ක් පවත්වා උපකරණ ලබා දී ඇත. (පෝරණු, විදුලි සකපෝරු, විල්බැරෝ, උදලු) ව්‍යාපෘතිය අවසන්. |
| මාතර | **560,250.00** | ප්‍රතිලාභීන් 60ක් සඳහා පුහුණු වැඩසටහන් 07ක් පවත්වා උපකරණ ලබා දී ඇත. (විදුලි සකපෝරු , කිරි මුට්ටි නිෂ්පාදන යන්ත්‍ර, ගෑස් වළං අච්චු) ව්‍යාපෘතිය අවසන්. |
| හම්බන්තොට | **1,026,630.00** | ප්‍රතිලාභීන් 34ක් සඳහා උපකරණ ලබා දී ඇත. (පෝරණු ඉදිකිරීම සඳහා) ව්‍යාපෘතිය අවසන්. |
| මහනුවර | **214,260.00** | ප්‍රතිලාභීන් 30ක් සඳහා උපකරණ ලබා දී ඇත.(විදුලි සකපෝරු) ව්‍යාපෘතිය අවසන්. |
| ගාල්ල | **131,750.00** | ප්‍රතිලාභීන් 36ක් සඳහා පුහුණු වැඩසටහන් 04ක් පවත්වා උපකරණ ඇණවුම් කර ඇත. ව්‍යාපෘතිය අවසන්. |
| එකතුව | ***4,884,719.00*** | |

***මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයෙහි ඵලදායීතාවය ඉහළ නැංවීමට ලබා දී ඇති දායකත්වය***

*සමාලෝචිත වසරේදී මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයෙහි නියැලි කර්මාන්තකරුවන් සඳහා මැටි අඹරන යන්ත්‍ර හා විදුලි සකපෝරු ලබාදීම සඳහා මූල්‍ය සහාය ලබා දී ඇත. මෙමගින් ඉහළ ගුණාත්මකභාවයකින් යුතු මැටි ආශ්‍රිත නිෂ්පාදනයන් බිහි කිරීමේ හැකියාව ප්‍රතිලාභීන්ට ලැබී තිබේ. මැටි අඹරන යන්ත්‍ර භාවිතය මගින් මනා තත්ත්වයෙන් යුතු නිමැවුම් බිහි කිරීමට ඉඩ ප්‍රස්ථා සැලසී ඇත. තවද, සාම්ප්‍රදායික අත් සකපෝරු වෙනුවට විදුලි සකපෝරු ලබාදීමෙන් අවම කාලයක් තුළ අඩු පරිශ්‍රමයකින් වැඩි නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් බිහි කිරීමේ හැකියාව ප්‍රතිලාභීන්ට ලැබීමෙන් මෙම කර්මාන්තයේ ඵලදායීතාවය ඉහළ ගොස් ඇත. ඒ තුළින් ප්‍රතිලාභීන්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොල අවස්ථාවන් සුලභවීමත් සමඟ ග්‍රාමීය ජනතාවගේ ආදායම් මට්ටම ඉහළයාමක් සිදුවේ.*

## 9.15. ශීතාගාර නිර්මාණය, ඉදිකිරීම, ස්ථාපිත කිරීම හා පවත්වාගෙනයාම

මෙම ව්‍යාපෘතිය යටතේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් දඹුල්ල හා කැප්පෙටිපොළ ශීතාගාර දෙකක් ස්ථාපිත කරන අතර ඒ සඳහා පෞද්ගලික කෘෂි ව්‍යාපාර ආයතනයක් තෝරා රජය සමඟ ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කර තෝරාගනු ලැබූ කෘෂි ව්‍යාපාර ආයතනය මඟින් ශීතාගාර නිර්මාණය, ඉදිකිරීම, ස්ථාපිත කිරීම හා පවත්වාගෙනයාම යන සමස්ත ක්‍රියාවලිය සඳහා දායක විය යුතු ආකාරයෙන් සැලසුම් කර තිබුණි.

එහෙත් මෙම ක්‍රමවේදය වඩාත් සංකීර්ණ වන බැවින් පහත සඳහන් පරිදි අදියර 02 ක් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

- අන්තර්ජාතික තරඟකාරී ලංසු ක්‍රමය මඟින් කෘෂි ව්‍යාපාර සහ ශීත දාම පිළිබඳව අත්දැකීම් ඇති පෞද්ගලික කෘෂි ව්‍යාපාර ආයතනයක් තෝරා රජය සමඟ ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කිරීම.
- අදාළ සමාගම ස්ථාපිත කිරීමෙන් පසු එම නව සමාගම මඟින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් තෝරා ගනු ලබන කොන්ත්‍රාත්කරුවකු මඟින් ඉදිකිරීම් සිදු කිරීම.

මේ අනුව මෙහි පළමු අදියර යටතේ රජය සමඟ ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කිරීම සඳහා කෘෂි ව්‍යාපාර සමාගමක් තෝරා ගැනීම සඳහා යෝජනා කැඳවූ අතර යෝජනා විවෘත කරන අවස්ථාව වන විට යෝජනා භාර දී ඇත්තේ එක් ආයෝජකයකු පමණි.

මෙම යෝජනාව තාක්ෂණික ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇගයීම් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු තීරණය කිරීමට නියමිතය.

## 9.16. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන

විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලය 2015 සැප්තැම්බර් මස 21 වන දින සිට ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් කර ඇති අතර සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා මෙහෙයවීම් කටයුතු ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය මගින් සිදු කෙරේ. දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව 15කි.

විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රභේද තුනකි.

- කෘෂි නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් තොග මධ්‍යස්ථාන
- කෘෂි නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග/සිල්ලර වශයෙන් බෙදාහැරීමේ මධ්‍යස්ථාන
- නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සිල්ලර අලෙවි මධ්‍යස්ථාන

ආර්ථික මධ්‍යස්ථාන සියල්ලම අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ එක් එක් ආර්ථික මධ්‍යස්ථාන සඳහා පිහිටුවා ඇති කළමනාකරණ භාර මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ. කළමනාකරණ භාරයේ සභාපති ලෙස අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්ද, ලේකම් ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම් ද කටයුතු කරන අතර, වෙළෙඳ සංගමය හා ගොවි සංවිධාන නියෝජිතයන්ගෙන් සහ ආර්ථික මධ්‍යස්ථාන විෂය පථයට අදාළ වන රාජ්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් මෙම කළමනාකරණ භාරය සමන්විත වේ. අමාත්‍යාංශයේ ලේකම් මෙම කළමනාකරණ භාරයන්හි ස්ථාපනකරු වන අතර, අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරියෙකු කළමනාකරණ භාරයක සමාජිකත්වය දරයි. මෙම සියළුම කළමනාකරණ භාරයන් භාර ආඥා පනත යටතේ භාර ඔප්පු මගින් ස්ථාපිත කර ඇත.

## 9.16.1 නව විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

### ❖ කිලිනොච්චිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය

උතුරු පළාතේ කෘෂි නිෂ්පාදනයේ යෙදෙන ගොවි පවුල් 150,000ක් ඉලක්ක කරගනිමින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අම්බාල්කුලම් ග්‍රාම නිලධාරී වසමේ හෙක්ටයාර් 2.23ක් පමණ වන රජය සතු භූමියක මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත. වෙළෙඳ පරිශ්‍ර 40කින් සමන්විත මෙම මධ්‍යස්ථානය සඳහා ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 101ක් ආයෝජනය කර ඇත. අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් 2017.10.14 දින විවෘත කරන ලද මෙම මධ්‍යස්ථානය, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලයේ 14 වැන්නයි.



අතිගරු ජනාධිපතිතුමා විසින් කිලිනොච්චි ආර්ථික මධ්‍යස්ථානය විවෘත කිරීම සනිටුහන් කරමින් සමරු ඵලකය නිරාවරණය කිරීම........



අතිගරු ජනාධිපතිතුමා, ගරු අමාත්‍යතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් විසින් වෙළෙඳ පරිශ්‍ර නිරීක්ෂණය කරමින්...

### ❖ අම්පාර විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය

නැගෙනහිර පළාත තුළ කෘෂිකර්මික පිබිදීමක් ඇති වී තිබෙන අතර අම්පාර දිස්ත්‍රික්කයේ හා ඒ අවට ප්‍රදේශයන්හි ගොවි ජනතාවගේ කෘෂි නිෂ්පාදන සාධාරණ මිලකට අලෙවි කර ගැනීම සඳහා තරගකාරී වෙළඳපොළක් ඇති කිරීම සහ පාරිභෝගිකයාට කෘෂි නිෂ්පාදන සාධාරණ මිලකට ලබා ගැනීමට හැකි වෙළඳපොළක් ඇති කිරීමේ අරමුණින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රු.මිලියන 50 ක වියදමකින් විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි වෙළෙඳ පරිශ්‍ර 24 කින් සමන්විතව අම්පාර විශේෂිත ආර්ථික මධියස්ථානය 2017.12.01 දින විවෘත කරන ලදී. මෙම ආර්ථික මධ්‍යස්ථානය ආර්ථික මධ්‍යස්ථාන ජාලයේ 15 වැන්නයි.





❖ **වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය**

වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරනු ලබන මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 291කි. 2017 වසර සඳහා ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන මේ සඳහා ලබා දී ඇත. මෙම මධ්‍යස්ථානය වර්ග අඩි 180 බැගින් වූ ව්‍යාපාර පරිශ්‍ර 50කින් සමන්විතවේ.

මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කරන අතර මේ වන විට ඉදිකිරීම් කටයුතු අවසන් අදියරට පැමිණ ඇත. 2018.01.31 දිනට පෙර වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර මෙහි මූල්‍ය ප්‍රගතිය රු.මි.157.37 ක් ද භෞතික ප්‍රගතිය 90% ක් ද වේ.




ඉදිකරමින් පවතින වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ දර්ශන

❖ **මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කලුතාවලෙයි ග්‍රාම නිලධාරී වසමේ මෙම අර්ථික මධ්‍යස්ථානය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 300කි. එය වර්ග අඩි 180 බැගින් වූ ව්‍යාපාර පරිශ්‍ර 50 කින් සමන්විතවේ. 2017 අයවැය යෝජනා මඟින් මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 300ක ප්‍රතිපාදන ලැබී ඇත. මෙහි ඉදිකිරීම් කටයුතු 2017.07.22 දින ආරම්භ කරන ලද අතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදුකරනු ලැබේ. 2017.12.31 දින වන විට මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 90ක් නිම කර ඇත.




ඉදිකරමින් පවතින මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ දර්ශන

**විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන නවීකරණ කටයුතු**

**ආර්ථික මධ්‍යස්ථාන නවීකරණ කටයුතු සඳහා 2017 වසරේදී දේශීය අරමුදලින් රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන ලබා දී ඇත. එහි ප්‍රගතිය පහත පරිදිවේ.**

| නවීකරණ කාර්යය | ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| R පරිශ්‍රයේ වහලය ඉදිකිරීම | 10.00 | ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. | 2.43 |
| වැලිසර විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| ගොඩනැගිලි අංක 03 සඳහා වහලය ඉදිකිරීම | 6.35 | ඉදිකිරීම් අවසන් කර ඇත | 6.35 |
| නාම පුවරුව සකස් කිරීම | 1.83 | ඉදිකිරීම් අවසන් කර ඇත | 1.83 |
| වීදි ලාම්පු සවිකිරීම | 1.99 | වීදි ලාම්පු සවිකිරීමේ කටයුතු අවසන් කර ඇත. | 1.99 |
| කළමනාකරුගේ කාර්යාලය පිළිසකර කිරීම සහ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 1.68 | පිළිසකර කිරීම් කටයුතු අවසන් කර ඇත. | 1.64 |
| දෙවන හා තුන්වන ගොඩනැගිලිවල වැහිපීලි හා කාණු පද්ධතිය පිළිසකර කිරීම | 1.035 | පිළිසකර කිරීම් කටයුතු අවසන් කර ඇත. | .877 |
| ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| පොදු වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 1.16 | අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. | .746 |
| වීදි ලාම්පු සඳහා CFL බල්බ සවි කිරීම | 2.82 | විදි ලාම්පු සවි කිරීම් අවසන් කර ඇත. | 2.699 |
| ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම | 0.07 | අළුත්වැඩියා කටයුතු අවසන් ඇත | .062 |
| පොලිස් මුර කුටියක් ඉදි කිරීම | 2.082 | ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත. | 1.66 |
| වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| කාණු පද්ධතිය ඉදිකිරීම | 1.66 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 1.26 |
| කළමනාකරුගේ කාර්යාලය අළුත්වැඩියා කිරීම | 0.38 | අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. | .30 |
| මෝටර් සයිකල් අංගනයක් ඉදිකිරීම | .972 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 0.816 |
| කාමර 02ක වැසිකිළියක් ඉදිකිරීම | 0.752 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 0.595 |
| CCTV කැමරා පද්ධතියක් සවි කිරීම | .556 | සවි කිරීම් කටයුතු අවසන් කර ඇත. | .556 |
| නාම පුවරුව සකස් කිරීම | .362 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 0362 |
| අම්පාර විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීම,වැසිකිළි වල ඉදිකිරීම,ආරක්ෂිත වැටේ තීන්ත ආලේප කිරීම,ඇතුරුම් ගල් ඇතිරීම,ජල ටැංකිය සවිකිරීම | 2.50 | ඉදිකිරීම් අවසන් කර ඇත | 1.71 |
| මධ්‍යස්ථාන පිටුපස වැට සෑදීම/සමරු ඵලකය සැකසීම/ප්‍රධාන පිවිසුම් ගේට්ටුව සකස් කිරීම. | 1.43 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 1.43 |

| කුරුඳුවත්ත විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
|---|---|---|---|
| පරිශ්‍ර අංක 01 සහ 02 අතර බිත්තියක් බැඳීම සහ දොර අළුත්වැඩියා කිරීම | 0.055 | ඉදිකිරීම් අවසන් කර ඇත | 0.052 |
| කැප්පෙටිපොල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| කාණු පද්ධතිය සඳහා කොන්ක්‍රීට් ආවරණ යෙදීම | 3.47 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | 2.932 |
| කිලිනොච්චි විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | | | |
| ආරක්ෂක කුටි ඉදිකිරීම | 0.585 | | 0.534 |
| ජල සැපයුම ලබාගැනීම | 0.025 | | 0.025 |
| ආරක්ෂක වැට ඉදිකිරීම | 1.200 | | 0.983 |
| නාම පුවරුව සවිකිරීම | 0.588 | | 0.588 |
| කොඩි කණුව සඳහා වේදිකාව ඉදිකිරීම | 0.200 | | .163 |
| විදුලි සැපයුම ලබාගැනීම | 1.000 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | 0.844 |
| සූර්ය බල ශක්ති විදුලි බල්බ ස්ථාපිත කිරීම | 1.666 | | 1.666 |
| කැලෑ එළිපෙහෙලි කිරීම | 0.151 | | .151 |
| සමරු ඵලකය ඉදිකිරීම | 0.166 | | 0.166 |
| භූමිය පස් පුරවා සකස්කිරීම | 0.356 | | 356 |
| තීන්ත ආලේප කිරීම සහ සුළු අළුත්වැඩියා කටයුතු | 0.260 | | .260 |

## 9.16.2 විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල අභිවෘද්ධිය සඳහා 2017 වර්ෂයේ සිදුකළ කාර්යයන්

❖ **ආර්ථික මධ්‍යස්ථාන පිහිටි ඉඩම් පිළිබඳ අයිතිය තහවුරු කරගැනීම**

| අයිතිය අමාත්‍යාංශයට පවරාගත් | අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් පවතින |
|---|---|
| ඇඹිලිපිටිය | මීගොඩ |
| පිලියන්දල | රත්මලාන |
| වැලිසර | නුවරඑළිය |
| නාරාහේන්පිට | අම්පාර |
| තඹුත්තේගම | වේයන්ගොඩ |
| දඹුල්ල | කැප්පෙටිපොළ |
| කිලිනොච්චිය | කුරුඳුවත්ත |
| කන්දෙහන්දිය | |

❖ **විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා රජයේ තක්සේරු වටිනාකම ලබාගැනීම සහ ව්‍යාපාර පරිශ්‍රවල මාසික කුලිය සංශෝධනය කිරීම**

සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා රජයේ තක්සේරු වටිනාකම කැඳවන ලදුව, සියළුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා තක්සේරු වාර්තා සමාලෝචිත කාලසීමාව අවසාන වන විට ලැබී ඇත. ඒ අනුව, මෙම ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාර පරිශ්‍රයන්හි මාසික කුලිය එම තක්සේරු වාර්තා පදනම් කර ගනිමින් සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.

❖ **කාර්යපටිපාටි සංග්‍රහයක් සකස් කිරීම**

සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා කාර්යපටිපාටි සංග්‍රහයක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන අතර ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටි හා අදාළ වැටුප් තල සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

❖ **විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි පාරිභෝගික ද්‍රව්‍යවල මිල ගණන් පාලනය සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම**

කෘෂි නිෂ්පාදකයාට සාධාරණ සහ පාරිභෝගිකයාට සහනදායී මිලක් ලබාදීම සඳහා විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි විධිමත් අලෙවි ක්‍රමවේදයක් සැකසීම සඳහා මිල කමිටුවක් 2017.04.25 දින පත්කරන ලදී. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ගේ සභාපතිත්වයෙන් යුතු මෙම කමිටුවේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන ආයතනයන්හි නිලධාරීන් සාමාජිකයින්වේ.

මෙම මිල කමිටුව පිහිටුවන ලද්දේ පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාය.

1. කෘෂි නිෂ්පාදකයාට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහ පාරිභෝගිකයාට සහනදායී මිලකට ගුණාත්මක තත්ත්වයෙන් යුතු පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව සලසා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
2. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ආශ්‍රිතව ක්රියාත්මක වන අලෙවිදාම තුළ අතරමැදියන් ප්‍රමාණය අවම කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
3. විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි සිදුවන මිල උච්ඡාවචනයන් අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම
4. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලය තුළ පවතින මිල හා විවෘත වෙළෙඳපොළ මිල ගණන් පිළිබඳව දැනුවත්වීම සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස්කිරීම
5. කෘෂි නිෂ්පාදනවල පිරිවැය නිර්ණය කිරීම සඳහා බාහිර සාධකයන්හි බලපෑම පිළිබඳ අධ්‍යයනයක් සිදුකිරීම

මේ සම්බන්ධයෙන් මිල කමිටු සාමාජිකයින් වෙතින් සහ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවලින් යෝජනා ලබා ගෙන ඒවා පදනම් කරගෙන කෙටිකාලීන හා දිගුකාලීන නිර්දේශ ඇතුළත් කමිටු වාර්තාව සකස් කර ඉදිරිපත් කර ඇත. එම වාර්තාව අනුව මිල පාලනය සඳහා අවශ්‍ය පියවර කිහිපයක් ගෙන තිබේ.

## ❖ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල භාර අරමුදල්වලින් සංවර්ධන කටයුතු සිදුකිරීම

| ආර්ථික මධ්‍යස්ථානය | සංවර්ධන කටයුතු | ඇස්තමේන්තුගත මුදල (රු.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| තඹුත්තේගම | අභ්‍යන්තර මාර්ග පද්ධතියේ සීමා සළකුණු කිරීම | 719,000.00 | 100 | 100 |
| | ආපනශාලාවේ ගලී වල ඉදිකිරීම | 91,245.69 | 100 | 100 |
| | දැන්වීම් පුවරු ඉදිකිරීමට අදාළව කොන්ක්‍රීට් කැට 25ක් තැනීම | 94,975.33 | 100 | 100 |
| කැප්පෙටිපොල | රැස්වීම්ශාලාව සඳහා වැසිකිළියක් ඉදිකිරීම | 789,708.05 | 90 | - |
| | පරිපාලන ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | 514,962.47 | 100 | 100 |
| | අභ්‍යන්තර මාර්ගයේ සීමා සළකුණු කිරීම | 1,081,750.00 | 100 | 100 |
| නාරාහේන්පිට | එළවළු පරිශ්‍රයේ විදුලි පංකා සවිකිරීම | 2,367,082.24 | - | - |
| | පොලිස් මුරපොළ සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 756,885.67 | - | - |
| | රෙදිපිළි සංකීර්ණයේ සිවිලිම සකස්කිරීම | 3,929,984.10 | - | - |
| | ජල ටැංකිය තැන්පත් කර ආවරණයක් යෙදීම | 542,404.90 | - | - |
| | එළවළු පරිශ්‍රයේ විදුලි මීටර් සඳහා ආවරණයක් ඉදිකිරීම | 162,804.60 | - | - |
| | සමනල උයන පැත්තේ ආරක්ෂිත බැම්ම නවීකරණය කිරීම | 939,699.92 | - | - |
| වෙයන්ගොඩ | ආහාර ගබඩාවේ ආරක්ෂාවට චේන්ලින්ක් වැටක් ඉදිකිරීම | 2,789,963.69 | 100 | 100 |
| රත්මලාන | කසල එක්රැස්කිරීමේ ටැංකිය ස්ථාපිත කිරීම | 499,000.00 | 10 | - |
| | ජල ටැංකිය සඳහා ජලනල සවිකිරීම | 32,652.00 | 100 | 90 |
| | පොදු වැසිකිලි පද්ධතිය අළුත්වැඩියා කිරීම | 62,986.07 | 100 | 90 |
| | දෛනික කසල රඳවන ස්ථාපනය කිරීම | 410,850.00 | 90 | - |
| දඹුල්ල | පිටුපස රථගාල කාපට් කිරීම | 28,847,711.74 | - | - |
| | ගෘහස්ථ වහලයේ පිටුපස යකඩ කණු සඳහා කොන්ක්‍රීට් යෙදීම | 1,650,000.00 | - | - |
| | වැසිකිළි අපහරණ ටැංකිය ඉදිකිරීම | 5,733,400.00 | - | - |
| | ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම | 6,585,900.00 | - | - |
| පිලියන්දල | කාණු පද්ධතිය හා වැහිපීළි සකස් කිරීම | 1,225,900.10 | 100 | 100 |
| | එළවළු සේදීම සඳහා ස්ථානයක් සකස් කිරීම | 221,994.05 | 80 | - |
| නුවරඑළිය | වෙළෙඳකුටි සඳහා අපද්‍රව්‍ය බහාලන භාජන ලබාදීම | 250,000.00 | 100 | 100 |
| | රැස්වීම් ශාලාව සහ නේවාසිකාගාරය සඳහා කාපට් යෙදීම | 764,404.20 | 100 | 100 |
| | මධ්‍යස්ථානයේ ගොඩනැගිලි වල තීන්ත ආලේප කිරීම | 1,997,088.84 | 100 | 100 |
| | මධ්‍යස්ථානයේ ගේට්ටු 08ක් අළුත්වැඩියා කිරීම | 232,550.00 | 100 | 100 |
| | මධ්‍යස්ථානයේ පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම | 347,011.63 | 100 | 100 |
| | මධ්‍යස්ථාන කාර්යාලයේ ආරක්ෂිත කැමරා පද්ධතිය සඳහා ඉන්වර්ටර් සවි කිරීම | 350,000.00 | 50 | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | මධ්‍යස්ථාන ජල පොම්පාගාරය සඳහා sensor සවි කිරීම | 181,475.00 | | |
| වැලිසර | කිර කඩ 03ක් දැල් ගසා ආවරණය කිරීම | 93,500.00 | 100 | 100 |
| | කාණු පද්ධතිය කොන්ක්‍රීට් ගල්කැට දමා ආවරණය කිරීම(1 වන අධියර) | 65,000.00 | 100 | 100 |
| | නාන කාමරවල ජලය බැසයාම සඳහා භූගත වලක් සෑදීම (පළමු අදියර) | 85,500.00 | 100 | 100 |
| | කාණු පද්ධතිය කොන්ක්‍රීට් ගල්කැට යොදා ආවරණය කිරීම (දෙවන අදියර) | 92,000.00 | 100 | 100 |
| | පරිශ්‍රයේ සුදු ඉරි ලකුණු කිරීම | 378,190.44 | 100 | - |
| | කිර ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම | 84,694.50 | 100 | 100 |
| ඇඹිලිපිටිය | ආර්ථික මධ්‍යස්ථානයේ ප්‍රධාන නාම පුවරුව අළුත්වැඩියා කිරීම | 83,904.83 | 100 | 100 |
| කුරුඳුවත්ත | ආර්ථික මධ්‍යස්ථානයේ තීන්ත ආලේප කිරීම | 146,616.38 | 100 | 100 |
| එකතුව | | **65,202,796.44** | | |

❖ **විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ගිණුම් කටයුතු විධිමත් කිරීම**

විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන් හා ස්ථානභාර නිලධාරීන්ට ගිණුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම සඳහා නේවාසික පුහුණු වැඩසටහනක් 2017.11.10 සහ 11 යන දෙදින තුළ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වනු ලැබිණ. ඒ අනුව කාලයක් අක්‍රියවී තිබූ ගිණුම් කටයුතු යථාවත් කිරීමට ක්‍රියා කර ඇත.

**විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි මූල්‍ය ප්‍රගතිය**

| ආර්ථික මධ්‍යස්ථානය | මුළු ආදායම (රු.මි.) | මුළු වියදම (රු.මි.) |
|---|---|---|
| දඹුල්ල | 63.510 | 30.200 |
| කැප්පෙටිපොල | 13.982 | 10.992 |
| මීගොඩ | 12.937 | 12.723 |
| ඇඹිලිපිටිය | 5.237 | 4.543 |
| වැලිසර | 13.688 | 6.314 |
| තඹුත්තේගම | 27.238 | 9.104 |
| කන්දෙහන්දිය | .043 | .145 |
| නුවරඑළිය | 15.631 | 7.89 |
| වේයන්ගොඩ | 9.386 | 7.920 |
| කුරුඳුවත්ත | 1.628 | .863 |
| නාරාහේන්පිට | 50.282 | 15.791 |
| රත්මලාන | 13.610 | 7.331 |
| පිලියන්දල | 6.743 | 3.335 |
| කිලිනොච්චි | .121 | .334 |
| අම්පාර | .012 | - |

## 9.17. ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2017

අතිගරු ජනාධිපතිතුමා විසින් "2017 වර්ෂය දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය" ලෙස ප්‍රකාශයට අනුව දිළිඳුකම තුරන්කිරීමේ අරමුණ පෙරදැරි කරගත් වැඩසටහන් කෙරෙහි සුවිශේෂී අවධානයක් මෙම අමාත්‍යාංශය විසින් යොමු කරන ලදී. ග්‍රාමීය ජනතාව නගාසිටුවීම මෙන්ම නාගරික හා අර්ධ නාගරික කලාපවල අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදයම් මට්ටම ඉහළ නැංවීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණු පෙරදැරිව සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය වෙත දේශීය අරමුදලින් රුපියල් මිලියන 600 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි.

ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම වැඩසටහන යටතේ, ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතීන් තෝරාගත් දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වේ.

සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුර, මඩකලපුව, පොළොන්නරුව, මාතලේ, මොණරාගල, කළුතර, ගාල්ල, පුත්තලම, රත්නපුර සහ මුලතිව් යන දිස්ත්‍රික්ක තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් යොමු කරනු ලබන ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශය මගින් ඇගයීමකට ලක්කර සුදුසු ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අරමුදල් ලබා දී ඇත.

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය ක්‍රියාත්මකවේ. මේ යටතේ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය, බෝක්කු හා කුඩා පාලම්, කාණු පද්ධති ඉදිකිරීම් හා නවීකරණය, පොදු පානීය ජල පහසුකම් සම්පාදනය, පානීය ජල ළිං අළුත්වැඩියා කිරීම, බහු කාර්ය ගොඩනැගිලි හා වෙනත් පොදු ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම වැනි සංවර්ධන ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී.

ජීවනෝපාය සංවර්ධනය සඳහා අදාළ දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හඳුනාගනු ලබන අඩු ආදායම්ලාභී ජනතාව සඳහා ජංගම අලෙවි කුටි, වගා කටයුතු සඳහා ජල මෝටර්, කෘෂිකාර්මික කටයුතු සඳහා තණකොළ කපන යන්ත්‍ර, බිංදු ජල උත්පාදන යන්ත්‍ර, මහන මැෂින් හා ධීවර ආම්පන්න වැනි උපකරණ ලබාදීමට ද කටයුතු කර ඇත. තවද, මෙම වැඩසටහන මගින් ගෘහ කර්මාන්ත වැඩිදියුණු කිරීම හා කුඩා ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම, තාක්ෂණය ලබාදීම සහ උපකරණ ලබාදීම සඳහා ද අවස්ථාවන් සලසා ඇත. මේ යටතේ කරවල නිෂ්පාදනය, යෝගට්, ගොරකා පේස්ට්, ජෑම්, බිම්මල් පිරිසැකසුම, රසකැවිලි, බෑග්, මී මැසි පාලනය වැනි ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම, තාක්ෂණය හා පුහුණුව ලබාදීමට ද කටයුතු කර ඇත. මීට අමතරව, පශු සම්පත් සංවර්ධනය තුළින් ග්‍රාමීය ආර්ථිකය නැංවීමට ද මෙම වැඩසටහන යටතේ අවධානය යොමුකර ඇති අතර, ඒ අනුව කිරි ගවයින් හා කුකුළු පැටවුන් ලබාදීම සහ ගවගාල් ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දී ඇත.

ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2017 හි ප්‍රගතිය 2017.12.31 දිනට පහත පරිදිවේ.

**ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2017 හි ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශ ගණන | වෙන් කර ඇති ප්‍රතිපාදන (රු.මි.) | ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | අතැති බිල්පත් (රු.මි.) | එකතුව (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 22 | 220.0 | 55 | 16.34 | 152.13 | 168.47 | 85 |
| මඩකලපුව | 15 | 125.0 | 177 | 104.17 | 17.81 | 121.98 | 100 |
| පොළොන්නරුව | 07 | 70.0 | 73 | 33.78 | 34.73 | 68.51 | 100 |
| පුත්තලම | 16 | 25.6 | 1,135 | 24.18 | 0.92 | 25.10 | 100 |
| ගාල්ල | 14 | 25.6 | 243 | 11.54 | 12.07 | 23.61 | 100 |
| රත්නපුර | 15 | 25.6 | 60 | 13.95 | 10.85 | 24.80 | 100 |
| මුලතිව් | 06 | 25.6 | 33 | 9.53 | 15.69 | 25.22 | 100 |
| මාතලේ | 11 | 25.6 | 74 | 24.58 | 1.00 | 25.58 | 100 |
| කළුතර | 14 | 25.6 | 648 | 8.15 | 16.56 | 24.71 | 100 |
| මොණරාගල | 11 | 25.6 | 105 | 17.83 | 6.899 | 24.72 | 100 |
| එකතුව | **131** | **594.2** | | **264.05** | **268.65** | **532.70** | |




ගරු අමාත්‍යතුමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත මහන මැෂින් සහ වතුර මෝටර් බෙදාදුන් අවස්ථාවක්...



ගරු නියෝජ්‍ය අමාත්‍යතුමින් මන්මුනායිපත්තු හා එරාවූර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් වෙත මහන මැෂින් බෙදාදුන් අවස්ථාවක්...



ගරු නියෝජ්‍ය අමාත්‍යතුමින් පෝරතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් වෙත මැටි නිෂ්පාදන උපකරණ බෙදාදුන් අවස්ථාවක්...

# 10. 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

## 10.1. දේශීය කිරි නිෂ්පාදකයින් වෙත ප්‍රතිපූර්ණ ප්‍රදානයන් ලබාදීම

දේශීය කිරි නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ඔවුන් දිරිමත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගතවෙමින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන ග්‍රෑම් 400 කිරිපිටි පැකැට්ටුවක් සඳහා වන උපරිම සිල්ලර මිල රුපියල් 325 සිට රුපියල් 295ක් දක්වා අඩු කිරීමට 2016 අයවැය යෝජනාවක් මඟින් තීරණය කර ඇත. ඒ අනුව, අලෙවි කරනු ලබන සෑම ග්‍රෑම් 400 කිරිපිටි පැකැට්ටුවකටම රජය විසින් රුපියල් 30 ක සහනාධාර මුදලක් දේශීය කිරි නිෂ්පාදකයින් වෙත ලබාදේ. සමාලෝචිත වසරේදීද මෙම අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වගකීම අප අමාත්‍යාංශය වෙත පවරන ලදී. ඒ අනුව, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ නිර්දේශය මත 2017 වසර අවසන් වන විට, සී/ස පැල්වත්ත කිරි නිෂ්පාදන සමාගම වෙත රුපියල් මිලියන 154.69 ක සහ මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රුපියල් මිලියන 127.56ක ප්‍රතිපූර්ණ ප්‍රදානයන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් ලබා දී ඇත.

## 10.2 මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2017 අයවැය යෝජනා අනුව රුපියල් මිලියන 300 ක් ලබා දී ඇත.

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කලුතාවලෙයි ග්‍රාම නිලධාරී වසමේ මෙම මධ්‍යස්ථානය ඉදිකරනු ලබන අතර, මෙමගින් ගොවි ජනතාවගේ කෘෂි නිෂ්පාදන සඳහා වෙළෙඳපොල අවස්ථාවන් ඇති කිරීමත්, පාරිභෝගික ප්‍රජාව සඳහා සහනදායී මිල ගණන් යටතේ පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගැනීමේ අවස්ථාව ඇතිකිරීමත් අපේක්ෂා කෙරේ. මෙම මධ්‍යස්ථානය වර්ග අඩි 180 බැගින් වූ වෙළෙඳ පරිශ්‍ර 50 කින් සමන්විතවේ. මෙහි ඉදිකිරීම් කටයුතු 2017.07.22 දින ආරම්භ කරන ලද අතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදුකරනු ලැබේ. 2017.12.31 දින වන විට මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වලින් සියයට 90ක් නිම කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මි.221.55 කි. ව්‍යාපෘතියේ සියලු ඉදිකිරීම් කටයුතු 2018.01.31 දිනට පෙර අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 11. විශේෂ වැඩසටහන් සඳහා අප අමාත්‍යාංශයේ දායකත්වය සහ ළඟාකරගත් ජයග්‍රහණ

❖ **රජරට නවෝදය - ජනපති වැඩසටහන (2017 - 2020)**
**කෘෂි පාදක කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය**

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය මගින් කෘෂි පාදක කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය 2017-2020 කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 35,169 ක් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන අතර, මෙම මුදල චීන රජයේ අනුග්‍රාහක මූල්‍ය පහසුකම් මගින් සපුරා ගැනේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත උප ව්‍යාපෘතීන් පහත පරිදිවේ.

- කඳුරුවෙල කෘෂි ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම
- පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි සතිපොළ 15ක් සංවර්ධනය කිරීම
- තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය නවීකරණය කිරීම
- මෙ.ටොන් 3,000 බැගින් වූ ධාරිතාවයෙන් යුත් වී ගබඩා 07ක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත කිරීම
- දෛනික ධාරිතාවය මෙ.ටොන් 100ක් වන වී මෝලක් සහ මෙ.ටොන් 10,000 ක ධාරිතාවයෙන් යුත් වී ගබඩාවක් අනුරාධපුර ඔයාමඩුවේ ස්ථාපිත කිරීම
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොළොන්නරුව, වැලිකන්ද, කන්දෙකඩුව, ත්‍රිකෝණමඩුව, ඔයාමඩුව, පරසන්ගස්වැව යන ස්ථානවල නව කිරි ගොවිපොළවල් ස්ථාපිත කිරීම
- තඹුත්තේගම මහවැලි සත්ත්ව ව්‍යාපාරික ගොවිපොළෙහි සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් සීප්පුකුලම සත්ත්ව පාලන පුහුණු විදුහලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

කඳුරුවෙල කෘෂි ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථානය ඉදිකිරීම, මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත උප ව්‍යාපෘතීන් අතරින් ප්‍රධානතම උප ව්‍යාපෘතියයි. කඳුරුවෙල කෘෂි වෙළෙඳ ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 5,200ක මුදලක් ආයෝජනය කිරීමට බලාපොරොත්තුවේ. ප්‍රධාන වාණිජ සංකීර්ණය හා කෘෂි කර්මාන්ත පරිශ්‍රයකින් සමන්විත මෙම මධ්‍යස්ථානය තුළ ග්‍රාමීය ගොවි ජනතාවගේ කෘෂි නිෂ්පාදන මිලට ගැනීම සහ ඒවා අලෙවි කිරීමට ඉඩ සලසාදීම ප්‍රමුඛව විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි වෙළෙඳ පරිශ්‍ර 200 ක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

කඳුරුවෙල කෘෂි ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම 2017 සැප්තැම්බර් 7 වන දින අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් සිදුවිය. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු අමාත්‍ය පී.හැරිසන් මැතිතුමා, ගරු උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය පේෂල ජයරත්න බණ්ඩාර මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ චීන තානාපතිතුමන් ප්‍රමුඛ දෙස් විදෙස් සම්භාවනීය අමුත්තන් රැසක්ද මුල්ගල තැබීමේ උත්සවයට එක්වූහ. අදාළ භූමිය පිළියෙළ කිරීම් කටයුතු මේ වසර තුළදී සිදු කෙරේ.









*අතිගරු ජනාධිපතිතුමන් කදුරුවෙල කෘෂි ආර්ථීක වෙළෙඳ මධ්‍යස්ථානය සඳහා මුල්ගල තැබූ*

- **ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන - හොඳම කිරි ගොවියා / කිරි සැකසුම්කරු තේරීමේ තරඟය**

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ග්‍රාමීය ආර්ථීකය පිළිබඳ අමාත්‍යාංශය, ජනාධිපති කාර්යාලය හා ඒකාබද්ධව හොඳම කිරි ගොවියා / කිරි සැකසුම්කරු තේරීමේ දීප ව්‍යාප්ත තරඟයක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දායකත්වයෙන් සංවිධානය කරන ලදී.

එහිදී, හොඳම කිරි ගොවියා තේරීම සඳහා තරඟ ඉසව් 03 ක්ද, හොඳම කිරි සැකසුම්කරු තේරීම සඳහා තරඟ ඉසව් 03 ක්ද ලෙස තරඟ ඉසව් 06ක් යටතේ ජාතික මට්ටමේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් 18 දෙනෙකු සඳහා සම්මාන හා ත්‍යාග ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.07.21 දින කන්තලේ දී සිදු කෙරිණ. මෙම තරඟාවලියෙහි දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රදානය පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හරහා සිදුකරන ලදී.



*අතිගරු ජනාධිපතිතුමන් අතින් ජයග්‍රාහකයකු සම්මානයක් ලබමින්......*

### ❖ Farm IQ දත්ත සංචිතය ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාවේ කිරි ගව පාලනයට අදාළ වැදගත් දත්ත හා තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීනව පවත්වාගැනීම සඳහා **Farm IQ** දත්ත සංචිතය ස්ථාපනය කිරීමට නවසීලන්ත රජයේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය හා අප අමාත්‍යාංශය අතර පැවති සාකච්ඡා අනුව දේශීය කිරි ගොවිපොළවල දත්ත එක්රැස් කිරීම හා අධීක්ෂණය සඳහා ජාලගත පරිගණක අධීක්ෂණ වැඩසටහනක් සහ පරිගණක මෘදුකාංගයක් හඳුන්වාදීමේ අරමුණින් එහි නියමු ව්‍යාපෘතිය දිවයිනේ වයඹ, සබරගමුව සහ ඌව යන පළාත්වල පවත්වන ලදී. එහිදී තෝරාගත් කිරි ගොවීන් සහ අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු සැසිවාර කිහිපයක් පවත්වන ලදී.




*කිරි ගොවීන් සහ අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද පුහුණු සැසිවාරයන්*

### ❖ ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාම සතිය තුළ ක්‍රියාත්මක කළ ජාතික පශු සම්පත් දින වැඩසටහන

මෙම වැඩසටහන 2017.10.08 වන දින ගන්නෝරුව පැළෑටි හා ජාන සංරක්ෂණ මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු අමාත්‍ය පී.හැරිසන් මැතිතුමා,මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු සරත් ඒකනායක මැතිතුමා, මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර සහ පරිසර කටයුතු ගරු අමාත්‍ය එම්.රාමේෂ්වරන් මැතිතුමා ඇතුළු පළාත් සභා ගරු අමාත්‍යවරුන් පශු සම්පත් දින වැඩසටහනට සහභාගී විය.

මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 300කට අධික පිරිසක් වෙත ප්‍රතිලාභ ලබාදුන් අතර, පශු සම්පත් ක්ෂේත්‍රයේ නියුතු රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සහභාගීත්වයෙන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ උපකරණ, පශු ඖෂධ සහ තෘණ වගා හා සංරක්ෂණ ක්‍රම පිළිබඳ ප්‍රදර්ශනයක්ද පවත්වනු ලැබිණ. මෙහිදී පශු සම්පත් ක්ෂේත්‍රයේ රක්ෂණ ක්‍රම හා බැංකු ණය පිළිබඳව ගොවි ප්‍රජාව දැනුවත් කිරීමටද කටයුතු කරනු ලැබිණ. ජාතික පශු සම්පත් දින වැඩසටහනට සමගාමීව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු විසින් විවිධ වැඩසටහන් සියළු පළාත් වල එම සතිය තුල ක්‍රියාත්මක කරන ලදී.










*පශු සම්පත් දිනයේ ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන්*

### ❖ "නිල මෙහෙවර ජංගම සේවය" - 2017

මේ යටතේ සමාලෝචිත වසර තුළ ගාල්ල, වවුනියාව, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් තුළ පැවති නිල මෙහෙවර ජංගම සේවා තුළින් සත්ත්ව පාලන ගොවීන්ගේ ගැටළු විසඳාලීම, සතුන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර සහ පශු සම්පත් ගොවීන් වෙත ප්‍රතිලාභ ලබාදීම ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් සිදු කෙරිණ.

| |
|---|
| ***2017.01.14 - ගාල්ල*** |
| *කුඩා පරිමාණ කිරි ගොවිපොළ සවිබල ගැන්වීම් ව්‍යාපෘතිය යටතේ ගොවීන් 54 දෙනෙකු සඳහා කිරි ගවයන් මිලදී ගැනීමට 50% රජයේ දායකත්වය යටතේ උපරිම රු.60,000 ක් බැගින් ලබාදීම* |
| *කුඩා පරිමාණ එළු ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගොවීන් 20 දෙනෙකු සඳහා එළුවන් මිලදී ගැනීමට 50% රජයේ දායකත්වය යටතේ රු.60,000 ක් බැගින් ලබාදීම* |
| *මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ් හරහා ක්‍රියාත්මක කුඩා පරිමාණ කිරි ගොවිපොළවල ගුණාත්මක කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය යටතේ ගොවීන් 20 දෙනෙකු සඳහා උපරිම රු. 60,000 ක් බැගින් ලබාදීම* |
| *සත්ත්ව පාලනය පිළිබඳ මහජනතාවට උපදෙස් ලබාදීම සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් ප්‍රදර්ශන කුටියක්ද ඉදිරිපත් කිරීම* |
| *සුනඛයන් හා බළලුන් සඳහා ජලභීතිකා මර්දන එන්නත් නොමිලේ ලබාදීම, ගැහැණු සුනඛයින් සහ බළලුන් සඳහා නොමිලේ වන්ධ්‍යාකරණ සැත්කම් සිදුකිරීම, එළ හා මී ගවයන් සඳහා නොමිලේ කන් සලකුණු යෙදීම, සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය, සත්ත්ව පාලනය සම්බන්ධ නව තාක්ෂණික දැනුම සහ ගැටළු නිරාකරණය කිරීමේ වැඩසටහන්ද ක්‍රියාත්මක කිරීම* |
| ***2017.10.21- වවුනියාව*** |
| *සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය මඟින් ලබා දෙනු ලබන සේවාවන් පිළිබඳව පශු සම්පත් ගොවීන් සහ මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීම* |

.



*ගාල්ල දිස්ත්‍රික්කයේ පැවති නිල මෙහෙවර ජංගම සේවයේ අවස්ථාවක්*

### ❖ ශ්‍රී ලාංකීය කිරි නිෂ්පාදන විශිෂ්ටත්ව පුහුණු ප්‍රවේශය සඳහා වන හවුල්කාරීත්ව එකඟතාවය

ශ්‍රී ලාංකීය කිරි නිෂ්පාදන විශිෂ්ටත්ව පුහුණු ප්‍රවේශය සඳහා වන හවුල්කාරීත්ව එකඟතා ගිවිසුමට අත්සන් තැබීම නවසීලන්ත අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා සංචාරය තුළදී සිදුවූ අතර, මේ සඳහා පාර්ශවකරුවන් වශයෙන් නවසීලන්ත රජයේ විදේශ සහ වෙළඳ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහකොමසාරිස් ග්‍රැහැම් මෝටන් මහතා හා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් රේණුකා ඒකනායක මහත්මිය සහභාගී විය.

මේ යටතේ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කිරි ගොවීන් වෙත සපයන ව්‍යාප්ති සේවාවන්හි ගුණාත්මකභාවය හා ධාරිතාවය ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබාදීමට නවසීලන්ත රජයේ එකඟතාවය පළවිය.

මෙම වැඩසටහන මගින් කිරි ගව පාලනය දියුණු කිරීම හා එමගින් දළ දේශීය ආදායම ඉහළ නංවා සමාජයේ සෑම කොටසකටම සමාජ ආර්ථික දියුණුව සැලසීම ඉලක්ක කර ඇත. මේ යටතේ කිරිවල ගුණාත්මකභාවය, කිරි ගොවීන්ගේ දෛනික ආදායම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට බලාපොරොත්තු වේ.

සුළු පරිමාණ කිරි ගොවිපොළවල් සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වාදීම සඳහා මූලික ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු සිදුකර එම තොරතුරු අදාළ පාර්ශවයන් වෙත යොමු කර ඇත. කිරි ගව පාලනය ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය පුහුණුව හා මහ පෙන්වීම් කටයුතු ක්‍රියාත්මක කිරීමද මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ. පුහුණුකරුවන් පුහුණු කිරීම (ව්‍යාප්ති නිලධාරීන් 11) දේශීය හා විදේශීයව සිදුකර ඇත. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට එම පුහුණුකරුවන් දිස්ත්‍රික්ක 05 ක ව්‍යාප්ති නිලධාරීන් 83 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත. තවද නිලධාරීන් 309 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගි වී ඇත. මෙම වැඩසටහන ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය Pc tablets මිලදී ගෙන අදාළ නිලධාරීන් වෙත ලබාදීම දැනට සිදු කෙරේ.

## ❖ ලෝක ජලභීතිකා දින වැඩසටහන - 2017

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලෝක ජලභීතිකා දිනය සැමරීම සඳහා 2017 සැප්තැම්බර් 28 වන දින අනුරාධපුර, නැගෙනහිර නුවරගම්පළාත පශු වෛද්‍ය නිලධාරී කාර්යාල පරිශ්‍රයේදී “2030 දී ජලභීතිකාව තුරන් කරමු" යන ගෝලීය තේමාව යටතේ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු අමාත්‍ය, පී. හැරිසන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් වැඩසටහනක් පවත්වන ලදී.

මෙහිදී සතුන් සඳහා ජලභීතිකා එන්නත් ලබාදීම, සුනඛ වන්ධ්‍යාකරණයන් සිදුකිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලද අතර, මේ සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ පශු වෛද්‍ය විද්‍යා හා සත්ත්ව විද්‍යා පීඨයේ, පශු වෛද්‍ය නිලධාරීහුද සහභාගි වූහ.




*ජලභීතිකා දින වැඩසටහන - 2017 හි අවස්ථාවන්*